# මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ 2022.07.12 දින පැවති මහා සභාවේ වාර්තාවයි.

2022.07.12 වන දින පෙ.ව 09.30 ට පමණ ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිතුමියගේ ප්‍රධානත්වයෙන් සභා කටයුතු ආරම්භ කරන ලදී.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**

අද දින සභා රැස්වීම සඳහා පැමිණ සිටින ඔබ සියලුම දෙනා ඉතාමත් ආදරයෙන් පිළිගනිමින් ආගම සිහි කිරීමෙන් අනතුරුව අද දින සභා කටයුතු ආරම්භ කර සිටින අතර මීළඟට පසුගිය සභාවේ වාර්තාව සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

**ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

ගරු සභාපතිතුමියනි, පසුගිය සභා රැස්වීමේදී මා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රීමා නියෝජිත ආයතනය පිළිබඳ වූ යෝජනාවට අනුව යොමුකර ඇති ලිපියේ පිටපතක් ලබා දෙන ලෙසට ඉල්ලා සිටිමි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**

එම ලිපියට සමහර ගරු මන්ත්‍රීවරුන් තවමත් අත්සන් කර නැහැ.

**ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

මෙය එක්තරා හදිසි යෝජනාවක්. යෝජනාව ඉදිරිපත් කර මාසයක් පමණ ගත වෙනවා. ව්‍යාපාරිකයින්ගේ ලිපියත් ලබා දී තිබෙනවා. රැස්වීමක් පැවැත්වුවා. නමුත් මෙතෙක් ලිපිය යොමු නොකිරීම වැඩි ප්‍රමාදයක් වෙනවා.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**

ලිපිය සකස් කර තිබෙනවා. තවත් සමහර ගරු මන්ත්‍රීවරුන් අත්සන් නොකළ නිසා යොමු කළේ නැහැ.

**ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

ඒ සම්බන්ධයෙන් නගරයේ සිටින සියළුම වෙළෙන්දන් මෙය අත්සන් කර තිබෙනවා. අනිත් එක සභාවේ මන්ත්‍රී කණ්ඩායමද අත්සන් කර තිබෙනවා. එදා අපි කළ රැස්වීමෙහිද පැමිණි අය පවසා සිටියා සමුපකාරය සඳහා ප්‍රීමා වෙළඳ නියෝජිතභාවය ලබා දෙන්න කියා. ඉතින් මෙය සමුපකාරය සඳහා ලබා දුන්නා නම් අපට ගැටළුවක් නැහැ. දැන් තනි පුද්ගලයෙක් තබාගෙනනේ ගබඩා කරගෙන සිටින්නේ. මෙහි පාරිභෝගිකයන්ගේ පැත්තෙන්ද ප්‍රශ්න තිබුණා. නමුත් මෙතෙක් එය අත්සන් කර නොයැවුවේ නම් මාව විහිළුවක් වගේ වෙනවා. දැනට මාසයක් වෙනවා. අපගේ කාර්යභාරය ප්‍රමාද වන විටයි ප්‍රශ්න මතු වන්නේ. මෙය අත්‍යාවශ්‍ය දෙයක්. අද හරි අත්සනක් යොදා ලිපිය යොමුකර මට කොපියක් ලබා දෙන්න.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

ක්‍රමවේදයක් අවශ්‍ය නිසා තමයි පසුගිය සභා වාරයේදී මේ පිළිබඳව සාකච්ඡා කර අපි තීරණයක් ලබා ගත්තේ. ගරු මන්ත්‍රීවරුන් අත්සන් නොකළ නිසා ලිපිය තවමත් යොමු කර නැති බවට සාමාන්‍යයෙන් පැවසීම ඉතාමත් ප්‍රමාදයි නේද? අවශ්‍ය ස්ථානවලට ලිපිය ලැබී තිබුණා නම් ඒ සඳහා ක්‍රියාමාර්ග ලබා ගන්නවා. ඒ සමගම පසුගිය මාසයේ මගේ කතාවේදී විනාඩි 20 ක් මම කතා කර තිබුණා. හඬ පටිගත කිරීමත් මා ළඟ තිබෙනවා. මස්කෙළිය නගරයේ දකින්නට තිබෙන ප්‍රශ්න

රාශියක් හඳුන්වා දී මම කතා කළා. ඒ කිසිවක් වාර්තාවට ඇතුළත් වෙලා නැහැ. ඒ සියල්ල වාර්තාවට ඇතුළත් කර ගන්න. කිරිපිටි පැකට් කඩලා විකිණීම, පැම්පර්ස්වල මිල වසා ස්ටිකර් ඇලවීම, සහල්මිල, පිටි ප්‍රශ්නය ආදී බොහෝ ගැටළු සම්බන්ධයෙන් මා කථා කර තිබෙනවා. පාරිභෝගික අධිකාරිය වෙත ලිපි යොමු කරලත් තවම ආවේ නැහැ. වැදගත් කරුණු වාර්තාවට ඇතුළත් කර ගන්න.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
ඔබතුමා කතා කළ බොහෝ කරුණු වාර්තාවට ඇතුළත් කර තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
අපි මීට පෙර සාකච්ඡා කළ පරිදි ලංකා විදුලිබල මණ්ඩලය, වෙළඳ සංගමය, පොලිස් ස්ථානය ආදී ආයතන සම්බන්ධ කරගෙන ක්‍රියා කළ යුතුයි. පළමු රැස්වීම ඉතා සාර්ථකව අවසන් වුණා. සියලු දෙනාම පැමිණ සිටියා. සියලු දෙනාම කැඳවා සාකච්ඡා කර ඒ සඳහා ක්‍රියාත්මක වුණේ නැතිනම් ඒ අය මොනවද හිතන්නේ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
හොඳයි, අපි කඩිනමින් ලිපිය යොමු කරමු.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
2022.06.13 දිනැති සභා රැස්වීමේදී ලබා ගන්නා ලද තීරණ වලට අනුකූලව ලිපි යොමු කළ යුතු ස්ථානවලට ලිපි යොමු කරන ලෙසටත්, අවශ්‍යය ක්‍රියාමාර්ග ලබා ගන්නා ලෙසටත් ඉල්ලා සිටින අතර පසුගිය සභා වාරයේ සභා වාර්තාව නිවැරදි බවටත් මම යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා (ලං.ක.කො)</u>**
එම යෝජනාව මම ස්ථිර කරමි.

**තීරණඅංක 01**
2022.06.13 දිනැති සභා වාර්තාව නිවැරදි බවට සභාව විසින් ඒකමතිකව පිළිගන්නා ලද අතර එම සභා වාර්තාව සභා සම්මත විය.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
මීළඟට මාගේ විශේෂ යෝජනාවේ සඳහන් පරිදි, මරේ ප්‍රදේශයේ සිට විශාල පැමිණිලි තොගයක් ලැබෙමින් තිබෙනවා. වලදල, ගැටස්, රාජමලේ, මරේ, ෆොරස් ආදි ප්‍රදේශවල ජනතාව බස් ගාස්තු වැඩියෙන් අය කිරීම පිළිබඳව පැමිණිලි ඉදිරිපත් කර තිබෙනවා. ලිපිත් යොමුකර තිබෙනවා. මේ පිළිබඳව අපි ඩිපෝව සමග කතා කර තිබෙනවා. මරේ දක්වා ධාවනය වන ශ්‍රී ලංගම බස් සේවාව සුපුරුදු පරිදි යෙදවීමට පොරොන්දු වී තිබෙනවා. මේ පිළිබඳව අදාල කොට්ඨාශයේ ගරු මන්ත්‍රීවරුන්ගේ ද අවධානය යොමු කරන ලෙසට ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
පසුගිය කාලවලදී මටත් මේ පිළිබඳව පැමිණිලි ඉදිරිපත් කර තිබුණා. බස් ගාස්තුව රු. 400.00 යි, රු. 250.00 යි, රු. 280.00 යි කියලා අයකරනවාලු. පාරත් දැන් කාපට් කර තිබෙනවා. කි. මී. 14 ක් සඳහා ගාස්තුව කොපමණ ද කියලා පරිශීලනය කර එහි ධාවනය වන වාහන 05 ක රියදුරන් කැඳවා

දැනුවත් කිරීමක් කරන්න. ඒ ප්‍රදේශවල සිට මස්කෙළිය නගරය දක්වා පාසල් ශිෂ්‍යයන්ද පැමිණෙනවා. පව් නේද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
මෙම කාරණාව සම්බන්ධයෙන් මම මධ්‍යම පළාතේ ගමනාගමන අධිකාරී සමග කථා කළා. ලිපියක් යොමු කරන ලෙසට පැවසුවා.

**<u>ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)</u>**
මෙම කාරණාව සම්බන්ධයෙන් මාගේ අදහස් ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි. දැනට පවතින තත්ත්වය මත ගාස්තු වැඩි කළ යුතු නමුත් කොවිඩ් කාලයේදී මගින් 50 ක් පමණක් ප්‍රවාහනය කිරීමට යටත්ව අනුමැතිය ලබාදී ගාස්තු වැඩිකිරීම් සිදුකලා. එකී ක්‍රමය ඉවතලා දැනටමත් එම ගාස්තු පදනම් කරගනිමින් ගාස්තුව වැඩිකරනු ලබනවා. දැනට එක බස්රථයක බස් තුනක මගීන් රැගෙන යනු ලබනවා. ඒ සමගම ත්‍රිරෝද රථ රියදුරන් පිළිබඳව ද කරුණු කිහිපයක් සඳහන් කළ යුතුයි. ඉස්සර මෙහි සිට කැස්කීබන් වලට යන්න රු.100.00 ක්, රු.150.00 ක් අයකලා. පසුගිය සතියේ එක් අයෙක් රුපියල් රු.1000.00 ක් අය කර තිබෙනවා. ත්‍රීරෝද රථ හිමියන්ගේ ක්‍රියා කලාපය වැරදි ලෙසටයි දකින්නේ. එය ජනතාවට විශාල වශයෙන් බලපානවා. වැඩිකිරීම කවුරුවත් පිළිගන්නේ නැහැ. බ්‍රවුන්ස්වික් වලට රු.2000.00 ක් ඉල්ලනවා. දැනටමත් වැටුප අඩුයි. එයින් ත්‍රීරෝද රථයක් සඳහා රු. 2000.00 ක් දුන්නොත් බඩු මිලදී ගන්නේ කොහොමද?.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
ගරු මන්ත්‍රීතුමනි, ත්‍රීරෝද රථ ගාලේ සිටින අය කැඳවා අපි කතා කළා. සමහරුන් වාහනයෙන් බහින ලෙසටත් මේක තියා ගන්නා ලෙසටත් කියන බවට ඒ අයම පවසනවා.

**<u>ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)</u>**
සමහර අය කරන දේවල් පොදුවේ සඳහන් කරන්න බැහැ. සභාවෙන් ලියාපදිංචි කරන ලද ත්‍රිරෝද රථ තිබෙනවා. රථගාලේ ලියා පදිංචි වූ අය සඳහා ප්‍රමුඛතාවය ලබාදී ඉන්ධන ලබා දීමට අපි ක්‍රියා කළ යුතුයි. සභාවේ ලියාපදිංචි වූවන්ගේ නාම ලේඛනයක් ලබා දුන්නොත් ඒ අය ගිහින් ඉන්ධන ලබා ගනීවි. කුලියට සිටින අය එන්නේ නැහැ. නීතිය ක්‍රියාත්මක කිරීමට අවස්ථාවක් ලැබෙනවා. සභාවටත් ගරුත්වයක් ලැබේවි. මෙය රක්ෂාවක් වශයෙන් සිදු කරගෙන යන අයට මෙයින් ආරක්ෂාවක් ලැබෙයි.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
සභාපතිතුමියනි, මේ සම්බන්ධයෙන් මම සමූපකාර සමිතියේ සභාපතිතුමා සමඟ දුරකථන මාර්ගයෙන් කතා කළා. මස්කෙළිය අපගේ සභාවට අයිති ත්‍රීරෝද රථගාලෙහි ත්‍රීරෝද රථ සඳහා පළමු තැන ලබාදෙන්න කියා මා පවසා සිටියා. එතුමා පොරොන්දු වූවා ඉන්ධන පැමිණි විගස මස්කෙළිය සභාව යටතේ තිබෙන ත්‍රීරෝද රථ සඳහා මුල්තැන දෙමින් ඉන්ධන ලබාදෙන බවට. ඉන්ධන ලබාදුන් පසු ගොස් ඒවා ඉවත්කර නැවත ඉන්ධන ලබා ගැනීම සඳහා නොපැමිණෙන ලෙසද ඉල්ලා සිටියා. සම්පූර්ණයෙන්ම ඔවුන්හට මුල්තැන ලබාදෙන බවටද එතුමා විසින් පිළිගනු ලැබුවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
මීළඟට සභාවට ලැබී ඇති ලිපි සහ පැමිණිලි ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටිමි.

**ලිපි අංක 01**

යොමු කරන්නා - පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය.
විෂය - 2022 අප්‍රේල් මස සභා වාර්තාවේ නිරීක්ෂණ ලිපිය.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**
මෙම කාරණාවන් පිළිබඳව පසුගිය සභා වාරවලදී දීර්ඝ සාකච්ඡාවන් සිදුකළා. මගේ කතාවේදී මෙම කාරණාව පිළිබඳව මම ඉතාමත් පැහැදිලිව සඳහන් කර තිබුණා. පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයෙන් ලැබී ඇති ලිපිය සහ සභා වාර්තාව බැලුවොත් එය හොඳටම පැහැදිලි වෙයි. අපි සිදු කළ දේ වැරදි බවට අපිට හොඳටම පැහැදිලි වේවි. සභාවෙන් පෙන්වා දුන් කරුණු පිළිබඳව කඩිනමින් ක්‍රියාත්මක වී තිබුණේ නම් වෙන කෙනෙක් මේ පිළිබඳව පෙන්වාදීමට අවශ්‍යතාවයක් මතුවෙන්නේ නැහැ. විශේෂ සභාවක් කැඳවා මේ සඳහා තීරණයක් ලබාගෙන තිබුණේ නම්, මෙතරම් තර්ක කිරීමට අවශ්‍ය වෙන්නේ නැති බව මම එදාම පවසා සිටියා. ඉදිරි කාලයේ දී හෝ සභාව විසින් ලබා ගන්නා තීරණ සඳහා කඩිනමින් ක්‍රියාත්මක වන ලෙසට ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
පළාත් පාලන සහකාර කොමසාරිස් තුමාගේ ලිපියේ පිටපත් ගරු මන්ත්‍රීවරුන් වෙත ලබා දෙන්නේ නම් සුදුසු බවට මා අදහස් කරමි.

**ලිපි අංක 02**

යොමු කරන්නා - පළාත්පාලන සහකාර කොමසාරිස් කාර්යාලය.
විෂය - 2022 මැයි මස සභා රැස්වීම් වාර්තාවේ නිරීක්ෂණ ලිපිය.

**ලිපි අංක 03**

යොමු කරන්නා - පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය.
විෂය - සභාව සතු ඉඩම් පවරා ගැනීම සම්බන්ධව.

**ලිපි අංක 04**

යොමු කරන්නා - ජාතික විගණන කාර්යාලය.
විෂය - මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණජාතික විගණන පනතේ 11(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සමපිණ්ඩන වාර්තාව විගණනය පිළිබද වූ ලිපිය.

**ලිපි අංක 05**

යොමු කරන්නා - වලදල වතුයායේ මහජනතාව.
විෂය - පෞද්ගලික ගමනාගමන බස් සේවාව පිළිබඳ වූ ලිපිය.

**ලිපි අංක 06**
යොමු කරන්නා - විෂයභාරකරු, මස්කෙළිය ප්‍රාදේශීය සභාව.
විෂය - අයවැය සඳහා මහජනතාවගේ අදහස් හා යෝජනා ලබා ගැනීම සම්බන්ධව.

**තීරණඅංක 02**
ග්‍රාමීය සංවර්ධන සංගමය, කාන්තා සංගම් හා අනෙකුත් මහජනතාව නියෝජනය කරන සංගම් මඟින් අදහස් හා යෝජනා ලබා ගැනීමට සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී.

**ලිපි අංක 07**
යොමු කරන්නා - විෂයභාරකරු, මස්කෙළිය ප්‍රාදේශීය සභාව.
විෂය - වාහන අංක RA- 9713 ට්‍රැක්ටර් රථය හා 252-6523 අංක දරණ කැබ් රථය අලුත්වැඩියාව පිළිබඳ වූ ලිපිය.

**තීරණඅංක 03**
තාක්ෂණික කමිටුව සමඟ සම්බන්ධ වී එම කැබ් රථය හා ට්‍රැක්ටර් රථය වාහන අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට සභාව විසින් තීරණය කරන ලදී.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
මීළඟට මුදල් සහ අනෙකුත් කමිටු වාර්තා ඉදිරිපත් කිරීම සිදු කරමු.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
මුදල් කමිටු වාර්තාවේ, ජාතික වෘත්තීය පුහුණු අධිකාරියෙන් පුහුණු කරුවන් වශයෙන් සිටින නිලධාරීන් සඳහා දීමනාවක් ලබාදීම සම්බන්ධ කරුණු ඉදිරිපත් කර තිබෙනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
ඔව්, සභාවේ මුදල් තත්ත්වය පිළිබඳව අවධානය යොමුකර, ශිෂ්‍යයන් දෙදෙනෙකුට මාසිකව රුපියල් 2000.00 ක් බැගින් ලබා දීමට මම තීරණය කර තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
සභාවේ මුදල් තත්වය පිළිබඳ ව සඳහන් කළ නිසා එක කාරණාවක් සම්බන්ධව මම අහන්නම්, අපි මස්කෙළිය නගරයේ CCTV කැමරා කීයක් සවි කර තිබෙනවද? ඉන් කීයක් ක්‍රියාත්මක වෙනවාද?

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
04 ක් සවිකර තිබෙනවා. වර්ෂාව නිසා ඉන් කීපයක් පළුදු වෙලා.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
සමහර කාරණා නිරීක්ෂණය කර ගැනීම සඳහා තමයි CCTV කැමරා සවිකර තිබෙන්නෙ. ඉන් සමහර කැමරා පළුදු වෙලා කියා පවසනවිට, යම්කිසි සිද්ධියක් සිදුවූ අවස්ථාවකදී රජය වෙනුවෙන් සභාවෙන් ප්‍රශ්න කරන අවස්ථාවකදී, කැමරා පළුදු වී ඇතැයි කියා කොහොමද පවසා සිටින්නේ

**<u>සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
මැතකදී එය ගලවා පරීක්ෂා කරන අවස්ථාවේ එය පළුදු වී තිබුණ නිසා නැවතත් එය අලුත්වැඩියා කර සවිකර තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
මාසිකව එය පරීක්ෂා කරන්නේ නැද්ද?

**<u>සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
පරීක්ෂාකර සිටිනවා. මාර්ගයට අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධව පරීක්ෂා කරන්න තමයි කැමරා සවි කළේ.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ඉන්ධන පිරවුම්හල පිළිබඳව ඉදිරිපත් කළ පැමිණිල්ල පරීක්ෂා කිරීම සඳහා කැමරාව බලන අවස්ථාවේ එය ක්‍රියාත්මක වී නොමැති නම් නැවතත් එය අලුත්වැඩියා කර සවි කලාද?

**<u>සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
ඔව්, සවිකර තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ඉන්ධන පිරවුම්හල පිළිබඳව පැමිණිලි විශාල සංඛ්‍යාවක් පැමිණෙන නිසා CCTV කැමරා පද්ධතිය විධිමත් පරිදි පරිහරණය කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කරන ලෙසට ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
දැනට CCTV කැමරා පද්ධතිය සවි කර ඇති දිසාව සුදුසු නැහැ, එය සුදුසු දිසාවට සවි කරන්න.

**<u>ගරු මන්ත්‍රිනී කේ.ජී.කුසුමාවතී පෙරේරා මැතිතුමිය (ලං.ක.කො)</u>**
මුදල් කමිටු වාර්තාව සත්‍ය වාර්තාවක් බවට මම යෝජනා කර සිටිමි.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
එය මා ස්ථිර කරමි.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**
මුදල් කමිටු වාර්තාව තවමත් සම්පූර්ණයෙන් කියවා අවසන් කළේ නැහැ, ඊට පෙර කොහොමද යෝජනා ස්ථිර කරන්නේ. වැය ලේඛනයේ බස්නැවතුම්පොළ අසල ඇති ජල පද්ධතිය සඳහා රු.1350.00 ක බිලක් ගෙවා තිබෙනවා. එහි තවත් කාරණාවක් තමයි බස්නැවතුම්පොළ අසල ඇති ජල පද්ධතිය සඳහා රු.1430.00 ක් ගෙවා තිබෙනවා. දෙකම එක මාසෙක බිලක්.

**<u>සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
ගරු මන්ත්‍රීතුමනි, පොදු වෙළඳසැලටත් බස්නැවතුම්පොලේ ලිපිනය තමයි තිබෙන්නේ, එය වෙනස් කළ යුතුයි.

**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
වැය ලේඛණයේ පොඩි සටහනක් තැබුවා නම් ඒක පැහැදිලි වෙයි. පසුගිය සභා වාරයේ දී දෙවන වීදියේ ඇති වැසිකිළි පද්ධතියේ ජල පරිහරණය ගෙවීම් සම්බන්ධයෙන් සාකච්ඡා කළා. ඒ සඳහා ක්‍රියාමාර්ග ගත්තා ද? මේ වතාවේදීත් රු. 1000.00 ක මුදලක් ගෙවා තිබෙනවා.

**සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
දිනපතා එම වැසිකිළි පද්ධතිය පිරිසිදු කර එම ටැංකියට ජලය රැස්කර සිටිනවා.

**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
එහි එතරම් භාවිතා කරනවාද? සාමාන්‍යයෙන් නගරයේ නිවෙසක භාවිතයට ගනු ලබන්නේ මීටර් ටැංකිවල ජලයයි. මේ සඳහා රු. 500.00 ට අඩු බිලක් වතුර බිල සඳහා පැමිණෙයි. මෙහි රු. 1197.00 ක් යනු ලොකු ජල බිලක්. මෙපමණ භාවිතයට ගන්නේ නැහැ. වැසිකිළිය සඳහා ජලය යනවා කියා පැවසූවත් මෙය නාන පිහිල්ලක් නෙවෙයි.

**ගරු මන්ත්‍රී එස්.ඒ.දිසානායක මැතිතුමා (ශ්‍රී ලං.පො.පෙ)**
එහි පිහිටා ඇති වෙළඳසැල්වල හිමිකරුවන් එම වැසිකිලිය තමයි භාවිතා කරන්නේ.

**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
ගරු සභාපතිතුමියණි, 2022.07.07 දින පැවැති මුදල් කමිටු වාර්තාවට අනුව විෂය අංක 03 හි සඳහන් ජාතික වෘත්තිය පුහුණු අධිකාරියෙන් මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ පුහුණුකරුවන් වශයෙන් සම්බන්ධ කර ඇති පුහුණුකරුවන් සඳහා ප්‍රවාහන වියදම් ලබාදීම පිළිබඳව මුදල් කමිටුවට ඉදිරිපත් කර, මාසිකව රු. 2000.00 ක් බැගින් ලබාදීමට නිර්දේශ වී තිබෙනවා. මීට පෙරද එවැනි ලිපි සභාවට ඉදිරිපත් කර තිබෙනවා. මීට පෙර පුහුණු කරුවන් සඳහා කොපමණක් ගෙවා තිබෙනවාද? දැනට කුමන පදනමකින් මෙම රු. 2000.00 ක් තීරණය කළා ද? ඒ අය කුමන ප්‍රදේශයක සිටද පැමිණෙන්නේ කියන කරුණුත් පැහැදිලි කළා නම් හොඳයි.

**සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
එක් අයෙක් කුඩා මස්කෙළියේ සිටද අනෙක් කෙනා මස්කෙළියේ සිටද පැමිණෙනවා. සාමාන්‍යයෙන් පැමිණෙන පුහුණු කරුවන් සඳහා දින 20 ක් සඳහා රු 500.00 බැගින් ගෙවීම් කරනු ලබනවා. දැනට රටතුල පවතින ආර්ථික තත්වය සැලකිල්ලට ගනිමින් රු 2000.00 ක් ගෙවීමට නිර්දේශකර කර තිබෙනවා. මේ අය ළඟ සිට පැමිණෙන නිසා මේ ප්‍රමාණය ලබා දෙන්න තීරණය කළා.

**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
මින් ඉදිරියේදී සාමිමලේ ප්‍රදේශයේ සිට හෝ වෙනත් ඈත ප්‍රදේශයක සිට හෝ පැමිණිය හොත් ආර්ථික තත්වය සැලකිල්ලට ගනිමින් රු. 2000.00 ක් වැනි ප්‍රමාණයක් සඳහා තීරණයකට පැමිණෙන්න එපා. හේතුව ඈත ප්‍රදේශවල සිට පැමිණෙන අයත් සිටිනවා. ඉදිරියේදී පැමිණෙන්නත් සිටිනවා. රටතුල පවතින ආර්ථික තත්වය මත රු. 2000.00 ක් ප්‍රමාණවත් නැහැ. පසුගිය කාල වලදී රු. 1000.00 දක්වා අපි ගෙවා තිබෙනවා. මීට පෙර සභාවේ සාකච්ඡා කර තිබෙනවා. වියදම් භාගෙට භාගයක් වැඩි වී තිබෙනවා. නමුත් මේ අය ප්‍රයෝජනයට ගනිමින් කාර්යාලයේ අතිරේක වැඩ රාශියක් ඉටුකර ගැනීමට අවස්ථාව තිබෙනවා. එනිසා මෙම රු. 2000.00 ක ප්‍රමාණය අනෙකුත් අනවශ්‍ය වියදම් අඩුකර ගනිමින් රු. 3500.00 ක් හෝ රු. 5000.00 ක් දක්වා ලබාදීම සුදුසු වෙනවා.

ගරු සභාපතිතුමියනි, කරුණු 5 ක් හෝ 6 ක් සඳහා මුදල් කමිටුව විසින් නිර්දේශ ලබාදී තිබෙනවා. එයින් දෙවෙනි නිර්දේශය සඳහායි මා මෙම අදහස් ඉදිරිපත් කර සිටියේ. මුදල් කමිටුව ඉදිරිපත් කර ඇති නිර්දේශ සඳහා තීරණයක් ලබාගෙන ඉන් අනතුරුව තමයි මුදල් කමිටු වාර්තාව යෝජනා ස්ථිර කළ යුත්තේ.

**<u>ගරු මන්ත්‍රී එස්.ඒ.දිසානායක මැතිතුමා (ශ්‍රී ලං.පො.පෙ)</u>**
ගරු සභාපතිතුමියනි, ඔබතුමන්ලා විසින් මෙය මුදල් කමිටුව වෙත යොමුකර සිටියා. නමුත් ලේකම්තුමා පවසා සිටියේ සභාවේ මුදල් අඩුපාඩුකම් පවතින නිසා අපිට මුදලක් ලබාදිය නොහැකි වුවත්, රු. 1000.00 ක මුදලක්වත් ලබා දෙමුද කියා. ඉන් පසුවයි අපි යෝජනා කර සිටියේ රු. 2000.00 ක් ලබාදෙමු කියා. මන්ත්‍රීතුමා පවසන පරිදි මීට කළින් අප විසින් ඔවුන්ට රු.10000.00 ක් ගමන් ගාස්තු ලෙස ගෙවා තිබෙනවා නම්, දීමට සභාවේ මුදල් තිබෙනවා නම් එය ලබා දුන්නාට ගැටළුවක් නැහැ. මුදල් නොමැති නිසා තමයි අපි මෙම මුදල ලබා දීමට තීරණය කළේ.

**<u>සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
ආරම්භයේදී සාමිමලේ, ලකම් ප්‍රදේශවල සිට පැමිණෙන නිසා අපි සාකච්ඡාකර ඒ අයට ලබා දුන්නා. දැනට සභාවේ පවතින මූල්‍යමය තත්ත්වය නිසා මේ සම්බන්ධයෙන් පසුව සලකා බලමු.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ලේකම්තුමාගේ පැහැදිලි කිරීම මා හට පිළිගත හැකියි. අද තිබෙන තත්වය අනුව ඔවුන් කාර්යාලයේ තිබෙන පහසුකම් භාවිතයට ගැනීම ප්‍රශ්නයක් නෙවෙයි. නමුත්, ඔවුන් කාර්යාලයට නිසි වෙලාවට පැමිණිය යුතුයි. කාර්යාලයට පැමිණිය යුතු ආකාරයට පැමිණිය යුතුයි. මීට කළින් අපි රු. 10000.00 ක් ලබා දී තිබෙනවා. එය රු. 2000.00 ක් දක්වා අඩු කර තිබෙනවා. ඇත්තටම ඒ අයට ලබාදිය යුතුයි. මීට පෙරද සභාව පටන් ගන්නා මුල් අවස්ථාවේදී මෙවැනි නිලධාරීන් සභාවේ හොඳින් සේවය කර සිටියා. එනිසා මෙවැනි අවස්ථාවලින් අපි ප්‍රයෝජන ලබා ගත යුතුයි. එනිසා මෙම මුදල වැඩිකර ලබා දුන්නොත් හොදයි.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
එසේ නම් රු. 1500.00 ක් ඊට එකතු කර ලබාදෙමු.

**<u>සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
දැනට පවතින තත්වය අනුව ප්‍රමාණය වැඩි කිරීම ගැටළු සහගතයි. දිනපතා ආදායම් බදු එකතුකර ගැනීම සඳහා අපගේ නිලධාරීන් යනවා. ඒ අයටත් යම්කිසි ගමන් වියදමක් ගෙවනවා. ඉන් පිට ප්‍රදේශවල සිට පැමිණෙන අය සඳහා බස් ගාස්තුව අවශ්‍ය නිසා සලකා බලමු.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
පුහුණුකරුවන් වශයෙන් බඳවා ගන්නා අය ඉතා කැපවීමෙන් වැඩ කරනවා. අපි දිමනාවක් ලබාදීම ඒ අය දිරි ගැන්වීමක් වේවි.

**<u>ගරු උප සභාපති පී.පී.ප්‍රදීපන් මැතිතුමා (ලං.ක.කො)</u>**
පුහුණුකරුවන් පිළිබඳව තීරණයක් ලබා ගන්න. එකී කාල වකවාණුව සඳහා එක් අයෙක් පමණයි අපි බඳවා ගන්නේ කියා අපි තීරණය කර, ඒ අය සඳහා එම දීමනාව ලබා දෙන්න.

**සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
එකම අවස්ථාවේ දෙදෙනෙක් බඳවා ගත හැකියි.

**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**
ගරු සභාපති තුමියනි, මට සැකයක් මතු වෙනවා. මුදල් වාර්තාව සියලු දෙනා වෙත කලින්ම ලබා දී තිබෙනවා. හේතුව මෙතෙක් වේලා සභාවේ සිදුවෙන දේවල් පිළිබඳව කිව යුතුයි. මුදල් කමිටු වාර්තාව යෝජනා කර ස්ථිර කළායින් පසුව තවදුරටත් මුදල් කමිටු වාර්තාව පිළිබඳව තර්ක විතර්ක සිදුවෙමින් පවතිනවා. හේතුව එකම කාරණාවක් සඳහා දෙවතාවක් ඉදිරිපත් කරන ලද ප්‍රශ්න වලට ගරු සභාපතිතුමිය පිළිතුරු දෙමින් සිටිනවා. ගරු මන්ත්‍රී කේ. සුරේෂ් කුමාර් මැතිතුමා ප්‍රශ්න කර තිබුණා. ඊට පෙර එම ප්‍රශ්නයම ගරු මන්ත්‍රී පී. රාජ්කුමාර් මැතිතුමාද විමසා තිබුණා. එකම ප්‍රශ්නය සඳහා දීර්ඝ වශයෙන් තර්ක විතර්ක කරමින් සිටිනවා. එකම කාරණාවක් සඳහා ඉදිරිපත් කළ ප්‍රශ්න දෙකටම ගරු සභාපතිතුමිය පිළිතුරු ලබාදෙමින් සිටින එක ප්‍රශ්නයක්. මේ වගේම දැනට ගරු මන්ත්‍රීවරුන් සභාවට පැමිණෙන එකත් ඉතාමත් අමාරුයි. එනිසා මේ අවස්ථාවේදී මේ අයට ආර්ථික තත්වය සලකා බලමින් යම්කිසි ප්‍රමාණයක් ලබා දීමට තීරණය කළා සේ ගරු මන්ත්‍රීවරුන්ටද පැමිණීම දුෂ්කර වී ඇති බැවින් ගරු මන්ත්‍රීවරුන්ටත් මුදල වැඩි කළ යුතු යැයි ඉල්ලා සිටිමි. හේතුව මස්කෙළිය නගරයේ සිට මෙහි පැමිණෙන අයට රු.5000.00 යි, රු.6000.00 යි, රු7000.00 යි කියා අනුමැතිය ලබා දීමේදී ගරු. මන්ත්‍රී නිත්‍යානන්දන් මැතිතුමා ලක්ෂපාන සිට පැමිණෙනවා, අනෙකුත් ගරු මන්ත්‍රීවරුන් ද බස්වලින් පැමිණෙනවා, එනිසා මේ අයටත් ලබාදීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරමි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**
මුදල් කමිටු වාර්තාව පිළිබඳව සාකච්ඡා කළේ නැහැ කියලා නැගිට කතා කළා. සුපුරුදු වශයෙන් වාර්තාව සභා සම්මත වූවායින් පසුව ඒ පිළිබඳව සාකච්ඡා කරන එක අපිට නිරීක්ෂණය කළ හැකියි. එතුමා විසින් අහන ලද ප්‍රශ්නයමයි මෙතුමාත් අසා සිටියේ. සභාපති වශයෙන් ඊට පිළිතුරු ලබා දීමේ අවශ්‍යතාවයක් මට උදාවුනා.

**ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රී තුමා ඉදිරිපත් කළ ප්‍රශ්නය නිවැරදියි. නමුත් මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීවරයෙකු වශයෙන් මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ වියදම් වාර්තාව පිළිබඳව ප්‍රශ්න කිරීමට මට සියළුම බලතල තිබෙනවා. වියදම් වාර්තාව සියලුම මන්ත්‍රීවරුන් කියවමින් සිටින අවස්ථාවේදී තමයි ගරු මන්ත්‍රී පෙරේරා මැතිතුමිය යෝජනා කළේ. තවමත් ලේඛනය කියවා අවසන් නැහැ. එය තේරුම් ගත යුතුයි. මුදල් වාර්තාව සමග වියදම් වාර්තාව අපිට සංසන්දනය කර බලන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**
මම කියන්නේ මේක තමයි. මීට පෙර සිදු කළ සියලුම කාරණාවල වැය ප්‍රමාණය වැඩියි. අඩු කළ යුතු බවට ඔබම පවසා තිබෙනවා. දැනට සභාවේ මුදල් තත්ත්වය සැලකිල්ලට ගනිමින් ඔබතුමිය කියන්නේ වැඩි කළ යුතු බවටයි. මේක කෙතරම් දුරට සුදුසුද යන්න ප්‍රශ්නයක් මතු වෙනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
හොඳයි ගරු මන්ත්‍රීතුමනි, ඉදිරියේ දී පැවැත්වීමට නියමිත මුදල් කමිටුවේ දී සභාවට ලැබෙන ආදායමට අනුව සාකච්ඡා කර යම් මුදලක් තීරණය කරමු.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ගරු මන්ත්‍රිතුමා පවසන්නේ මස්කෙළිය සිට එන අයටත් වෙනත් ප්‍රදේශවල සිට එන අයටත් එක සමාන ගෙවීමක් තමයි කරන්නේ, ඒ වගේම සියලුම ගරු මන්ත්‍රීවරුන්ටත් දීමනාව එකයි එය මතු කර පෙන්වන්න අවශ්‍ය නැහැ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මුදල් කමිටු වාර්තාව සභා සම්මත වුණා ද?

**<u>ගරු මන්ත්‍රිනී කේ.ජී.කුසුමාවතී පෙරේරා මැතිතුමිය (ලං.ක.කො)</u>**
ගරු සභාපතිතුමියනි, මා විසින් ඒ කළ වැරැද්ද සඳහා සමාව අයැද සිටින අතර මා යම් දෙයක් පැවසිය යුතුයි. මෙම රු. 2000.00 ප්‍රශ්නය මේ ගරු මන්ත්‍රීතුමා පැමිණීමට ප්‍රථම සාකච්ඡාකර සිටියා. එවිට කවුරුත් නිශ්ශබ්ද වී සිටියා. එවිට එම ප්‍රශ්නය එතැනින් ඉවරයි. ඊට පසුව නැවත කතා කළ නිසා තමයි මේ ප්‍රශ්නය ඇදී ආවේ. එය මා සඳහන් කළ යුතුයි. අපි වගේ කෙනෙක් මේ සභාවේ කතාකරන විට හැම මොහොතේදීම මේ අය අපට විරුද්ධවාදීව සභාවේ කතා කර සිටිනවා. කුමක් කතා කළත් මේ අය නැගී සිට අපට කුමක් හෝ පවසනවා. එනිසයි අපි නිශ්ශබ්දව සිටින්නේ. අපටත් අයිතියක් තිබෙනවා මෙම සභාවේ කතා කිරීම සඳහා. වචනයක් කතා කරන හැම අවස්ථාවකම මේ අය අපට ප්‍රශ්නයක් ඇති කරනු ලබනවා. එය හොඳ නැහැ. මෙතුමන්ලා වගේම අපිත් දේශපාලනය සඳහා පැමිණ තිබෙන්නේ කුමක් හෝ දැනුමක් ඇතිවයි. එනිසා මම මෙම මුදල් කමිටු වාර්තාව නැවත වතාවක් සත්‍ය වාර්තාවක් බවට යෝජනා කර සිටිමි.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
දෙවන වතාවටත් මුදල් කමිටු වාර්තාව මා ස්ථිර කරමි.

**<u>2022.07.07 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව නිර්දේශයෙන් පසු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.</u>**

**කාරණා අංක 01**
රිකාටන් කසළ කළමණාකරන මධ්‍යස්ථානයේ පවතින දුර්ගන්ධය ඉවත්කර ගැනීම සඳහා වූ ඖෂධ ගෙන්වා ගැනීමේ ලිපිය මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලදී.

**තීරණඅංක 04**
උක්ත කරුණට අදාලව මුලින්ම ඖෂධ සුළු ප්‍රමාණයක් මිළදී ගෙන එම ඖෂධ ප්‍රතිඵලදායක නම් නැවත ගෙන්වා ගැනීමට කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 02**
NITA ආයතනයේ සිට අප ප්‍රාදේශීය සභාව වෙත පුහුණු කටයුතු සඳහා නිලධාරීන් දෙදෙනෙක් යොදවා ඇති අතර එම නිලධාරීන් සඳහා පුහුණු දීමනා ලබාදීම සම්බන්ධ ලිපිය මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලදී.

**තීරණඅංක 05**
ඉහත කරුණ සම්බන්ධයෙන් සභාවේ මුදල් තත්වය සැලකිල්ලට ගෙන එම නිලධාරීන්හට ලබාදෙන මුදල් ප්‍රමාණය තීරණය කිරීමට සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**කාරණා අංක 03**
කාර්යාලය සඳහා අවශ්‍ය Printing Items සඳහා මිල ගණන් ලැබී තිබුණු අතර එම මිළ ගණන් විවෘත කරන ලදී.

| No | Item | A2B creation | Vijaya graphic | New JS Printers |
|---|---|---|---|---|
| 1 | P.S. 01 | 800.00 | 700.00 | 650.00 |
| 2 | P.S. 02 | 850.00 | 800.00 | 700.00 |
| 3 | P.S. 03 | 950.00 | 950.00 | 850.00 |
| 4 | Field receipt book (Sub recipt book) | 700.00 | 650.00 | 550.00 |
| 5 | Re shedule book | 1,550.00 | 1,500.00 | 1,400.00 |
| 6 | Cheque book register | 2,400.00 | 2,300.00 | 2,200.00 |
| 7 | Cash Summery Book | 2,600.00 | 2,550.00 | 2,400.00 |
| 8 | Vote Ledger | 2,600.00 | 2,550.00 | 2,400.00 |
| 9 | General Ledger | 2,700.00 | 2,600.00 | 2,500.00 |
| 10 | Advance Ledger | 3,800.00 | 3,600.00 | 3,500.00 |
| 11 | Payment cash book | 4,700.00 | 4,600.00 | 4,500.00 |
| 12 | Deposit ledger | 3,700.00 | 3,600.00 | 3,500.00 |
| 13 | Salary ledger | 4,300.00 | 4,200.00 | 4,000.00 |
| 14 | Loan ledger | 4,700.00 | 4,600.00 | 4,500.00 |
| 15 | Audit report ledger | 3,700.00 | 3,600.00 | 3,500.00 |
| 16 | Personal file register | 3,700.00 | 3,600.00 | 3,500.00 |
| 17 | Inventory book | 3,850.00 | 3,800.00 | 3,700.00 |
| 18 | Fuel register | 3,900.00 | 3,850.00 | 3,700.00 |
| 19 | Travelling expense register | 3,900.00 | 3,850.00 | 2,400.00 |
| 20 | Over time register | 2,550.00 | 2,500.00 | 2,400.00 |

| | | | | |
|---|---|---|---|---|
| 21 | stamp register | 2,550.00 | 2,500.00 | 2,400.00 |
| 22 | Attendance register | 2,550.00 | 2,500.00 | 2,400.00 |
| 23 | Leave ledger | 3,900.00 | 3,800.00 | 3,700.00 |
| 24 | Indent book | 1,700.00 | 1,600.00 | 1,500.00 |
| 25 | Stock register | 2,600.00 | 2,500.00 | 2,400.00 |
| 26 | Stores Issue Book | 1,700.00 | 1,600.00 | 1,500.00 |
| 27 | Stores return issue book | 1,700.00 | 1,600.00 | 1,500.00 |
| 28 | Good received note book | 1,700.00 | 1,600.00 | 1,500.00 |
| 29 | Construction Agrement - Legal 8 pg | 150.00 | 120.00 | 100.00 |
| 30 | Government fund relife ledger | 3,900.00 | 3,800.00 | 3,700.00 |
| 31 | Sundry creditors register | 4,700.00 | 4,600.00 | 4,500.00 |
| 32 | Sundry debitors register | 4,700.00 | 4,600.00 | 4,500.00 |
| 33 | Building application register | 3,700.00 | 3,600.00 | 3,500.00 |
| 34 | C of C certificate book | 1,000.00 | 950.00 | 850.00 |
| 35 | Council minutes pasting book | 4,550.00 | 4,450.00 | 4,300.00 |
| 36 | council Signature book | 2,700.00 | 2,600.00 | 2,500.00 |
| 37 | Council meeting attendance register | 2,700.00 | 2,600.00 | 2,500.00 |
| 38 | Street line certificate 50 set | 1,500.00 | 1,300.00 | 1,200.00 |
| 39 | Misc.Deposit ledger | 3,900.00 | 3,850.00 | 3,700.00 |
| 40 | Misc. Revenue ledger | 3,900.00 | 3,850.00 | 3,700.00 |
| 41 | Lease rent ledger | 4,500.00 | 4,300.00 | 420.00 |
| 42 | Trade license ledger | 4,700.00 | 4,600.00 | 3,600.00 |
| 43 | Assesment ledger | 4,700.00 | 4,600.00 | 3,400.00 |
| 44 | Water ledger | 4,700.00 | 4,600.00 | 4,000.00 |
| 45 | Environment lisens register | 4,550.00 | 4,450.00 | 4,300.00 |
| 46 | Pocket cheak roll | 1,650.00 | 1,500.00 | 1,200.00 |
| 47 | Board file | 700.00 | 500.00 | 300.00 |
| 48 | Fuel request | 1,000.00 | 900.00 | 750.00 |

| | | | | |
|---|---|---|---|---|
| 49 | Building application form | 200.00 | 180.00 | 160.00 |
| 50 | Red notice | 1,600.00 | 1,500.00 | 1,200.00 |
| 51 | Red notice (Water biil) | 1,600.00 | 1,500.00 | 1,200.00 |
| 52 | Red notice (Market shop) | 1,600.00 | 1,500.00 | 1,200.00 |
| 53 | Sub division application | 25.00 | 20.00 | 15.00 |
| 54 | Payment voucher form | 15.00 | 12.00 | 9.00 |
| 55 | Trade license application form A4 | 20.00 | 15.00 | 10.00 |
| 56 | Letter head A4 | 15.00 | 12.00 | 9.00 |
| 57 | Letter head A5 | 15.00 | 10.00 | 5.00 |
| 58 | Store issue order form | 25.00 | 20.00 | 10.00 |
| 59 | Environment lisens form set | 200.00 | 180.00 | 120.00 |
| 60 | Environment lisens inspection form set | 200.00 | 180.00 | 120.00 |

**තීරණඅංක 06**
කැඳවා තිබූ මිල ගණන් වලට අදාළව උසස් තත්වයෙන් යුත් භාණ්ඩ සඳහා අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ J.S.Printers ආයතනය වෙතින් අදාළ මිළදී ගැනීම් සිදු කිරීමට කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 04**
R D 1231 දරණ ට්‍රැක්ටර් රථය අළුත්වැඩියා කිරීම සම්බන්ධ ලිපිය මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලදී.

**තීරණඅංක 07**
එම ලිපියට අනුව දක්වා ඇති අඩුපාඩු බාස් කෙනෙක් මඟින් පරීක්ෂා කර එහි වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව එය තාක්ෂණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු මෙම රථය අළුත්වැඩියා කිරීමට කමිටුව විසින් නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 05**
සභා කටයුතු සඳහා අවශ්‍ය Sound System පිළිබඳව කරුණු සාකච්ඡා කරන ලදී.

**තීරණඅංක 08**
උක්ත කරුණට අදාලව මිළ ගණන් කැඳවීමට කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)**

මීළඟට ගරු මන්ත්‍රී කේ. නිත්‍යානන්දන් මැතිතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටිමි.

**ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා (ලං.ක.කො)**

2021 සහ 2022 වර්ෂවලදී ලංකාවේ සියලුම පළාත් පාලන ආයතන වල ගරු මන්ත්‍රීවරුන් මගින් වැඩසටහන් දියත් කිරීම සඳහා හිටපු මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා මගින් එක් මන්ත්‍රීවරයෙකුට මිලියන 4 බැගින් ප්‍රතිපාදන ලබා දුන්නා. එම ප්‍රතිපාදන මටත් ලැබුණා. එම ප්‍රතිපාදන වලින් මම මිලියන දෙකක් වටිනා මහන මැෂින් ප්‍රමාණයක් ඉල්ලා සිටියා. එයින් මිලියන 1.2 ක් වටිනා මහන මැෂින් ප්‍රමාණයක් පසුගිය සතියේ මාගේ කොට්ඨාශයට ලැබුණා. මම මාගේ කොට්ඨාශයේ පිහිටි වතු පහක් තෝරාගෙන ඉන් එක වත්තකින් දුප්පත් තරුණයින් දෙදෙනෙක් බැගින් තෝරාගනිමින් එම මහන මැෂින් බෙදා දී තිබෙනවා. ජනතාව විසින් දැනට එතුමා එපා කියා කිව්වාට මෙම අවස්ථාවේදී ජනතාවට මෙම මහන මැෂින් ලබාදුන් හිටපු මුදල් අමාත්‍ය තුමාටත්, අඹගමුව ප්‍රාදේශීය සභාවේ සම්බන්ධීකරණ කමිටු සභාපති ගරු රාමේෂ්වරන් මැතිතුමාටත්, ප්‍රාදේශීය ලේකම් තුමාටත්, මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති සහ ලේකම් තුමාටත් මාගේ ස්තූතිය මෙම අවස්ථාවේ දී පුද කර සිටිමි. මීළඟට මාගේ පළමු යෝජනාව වශයෙන් රු.450.00 ක් ලබාගන්නා සමෘද්ධි ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් ඉදිරිපත් කරමි. 2020 වර්ෂයේදී සමෘද්ධි දීමනාව වර්ග තුනකට වැඩි කරන ලදී. එය රු.1000.00, රු.2000.00, රු.3000.00 යනාදී වශයෙන් වෙන් කරන ලදී. එය පසුගිය වසරේ මැයි මාසයේ රු1000.00 රු.2000.00 ක් වශයෙන් ද, රු.2000.00 රු.3800.00 ක් වශයෙන් ද, රු.3000.00 රු.4500.00 ක් වශයෙන් ද ලබා දුන්නා. දැනට එම දීමනාව රු.2000.00 ක් ලබා ගන්නා ප්‍රතිලාභීන්ට රු.5000.00 ක් වශයෙන් ද, රු.3000.00 ක් ලබා ගන්නා ප්‍රතිලාභීන්ට රු.6300.00 ක් වශයෙන් ද, රු.4500.00 ක් ලබා ගන්නා ප්‍රතිලාභීන්ට රු.7500.00 වශයෙන් ද ලබා දෙනවා. එය ඇගයීමට ලක් විය යුතු කරුණක්. නමුත් පසුගිය සතියේ රු.2000.00 ක් ලබාගන්නා වැඩිහිටියන්ගේ දීමනාව රු.6000.00 ක් දක්වා වැඩි කර තිබෙනවා. නමුත් මෙම රු.450.00 ක කූපන් පත් ලබා ගන්නා අයත් සිටිනවා. ඒ අය සඳහා කිසිදු දීමනාවක් වැඩි කර නැහැ. මාගේ කොට්ඨාශයේ පිහිටි හැමිල්ටන් එකේ සිට නෝර්වුඩ් දක්වා ගොස් මෙම රු.450.00 ක කූපන් එකේ මුදල ලබා ගැනීම සඳහා එක්කෙනෙක් රු.700.00 ක් වියදම් කළ යුතු වෙනවා. ඒ වගේම ඒ අයගේ අනෙකුත් අවශ්‍යතා ද තිබෙනවා. එනිසා මම මේ පිළිබඳව සමෘද්ධි නිලධාරීන් සමග සාකච්ඡා කර සෘජුවම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගොස් කතා කළා. එම අවස්ථාවේදී ඒ අය මට පැවසුවේ මේ පිළිබඳව ඔබගේ සභාවෙන් යෝජනාවක් ස්ථිර කර තීරණයක් ලබාගෙන එහි වාර්තාවක් සකස් කර දෙන්නේ නම් එම වාර්තාව අවශ්‍ය ස්ථානවලට යොමු කර වැඩිකරගත හැකි බවටයි. මෙම සභාවේ සියලුම කොට්ඨාශ වල සාමාන්‍යයෙන් ප්‍රතිලාභීන් 10 ක් හෝ 20 ක් සිටිනවා. එසේ ගණනය කළහොත් මුලු සභාවටම 200 ක් හෝ 300 ක් සිටිනවා. දැන් තිබෙන රු.450.00 ක කූපන් පත ලබාගැනීමෙන් ඒ අයට කිසිදු ප්‍රයෝජනයක් නැහැ. රු.2000.00 ක් හෝ රු.3000.00 ක් ලබාදෙන්නේ නම් එය ප්‍රයෝජනවත් වේවි යන එක මාගේ අදහසයි. එනිසා මෙය මහජනතාව වෙත ලබාදීම අපගේ වගකීමක් බැවින් සභාව මගින් සමෘද්ධි බැංකුවට සහ ප්‍රාදේශීය ලේකම් වෙත ලිපියක් යොමුකරන ලෙසට ගරු සභාපතිතුමිය ගෙන් ඉල්ලා සිටිමි.

**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**

ගරු මන්ත්‍රී කේ. නිත්‍යානන්දන් මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සමෘද්ධි කූපන් එක පිළිබඳව දීර්ඝ වශයෙන් මම ද, ගරු මන්ත්‍රී නිත්‍යානන්දන් මැතිතුමාද, ගරු මන්ත්‍රී පී. රාජ්කුමාර් මැතිතුමා ද,

ගරු මන්ත්‍රී කේ. සුරේෂ් කුමාර් මැතිතුමා ද වැඩි අවස්ථාවලදී මෙම සභාවේ කතා කර තිබෙනවා. රු.450.00 ක් පමණක් නොව අසාධාරණයට ලක්වූ බොහෝ දෙනෙක් සිටිනවා. අනෙකුත් කොට්ඨාශවල මෙම කූපන් ප්‍රශ්නය කෙසේ තිබෙනවා දැයි අපි දන්නේ නැහැ. නමුත් මරේ, සීතගඟුල කොට්ඨාශවල මෙම ප්‍රශ්නය වැඩි වශයෙන් පවතිනවා. නුසුදුසු අයට මෙම කූපන් වැඩියෙන් ලැබෙනවා. සුදුසු අය ප්‍රතික්ෂේප වී තිබෙනවා. එම ලේඛනයට මම එකී නිලධාරී වෙත යොමු කර තිබුණා. එම ලේඛනය ලබාදීලත් සුදුසු අයට කිසිම සහනයක් ලැබුනේ නැහැ. ඊට හේතුව වශයෙන් ඡන්ද නාම ලේඛනය පදනම් කරගනිමින් බලන අවස්ථාවේ දී එකම ලේඛනයේ සියලුම දෙනා ඉන්නවා කියන කාරණාව ඉදිරිපත් කළා. අප ගම්මානවල පවුලේ සියලු දෙනා එකට ජීවත් වීමේ ක්‍රමය වැඩියෙන් දකින්නට තිබෙනවා. ඒ අයට ඡන්ද නාම ලේඛනය වෙන් කර තබාගත යුතුයි කියන එක දන්නේ නැහැ. එකම පවුලේ මුළුතැන්ගෙවල් තුනක් සකස් කරගෙන ජීවත්වන අයත් සිටිනවා. නිවෙස් වලට ගොස් තත්ත්වය පරිශීලනය කර ලබා දෙන්න කියන්න. උදාහරණයක් වශයෙන් වලදළ ප්‍රදේශයේ පුෂ්පලීලාවතී නම් ස්වාමිපුරුෂයා මියගිය කාන්තාවක් සිටිනවා. පුතාගේ දරුවා බලාගන්න කවුරුවත් නැහැ. මෙම කාන්තාවගේ ආරක්ෂාවෙන් තමයි එම දරුවා සිටින්නේ. ඒ අයට කෑම වේලක් කන්නවත් පහසුකමක් නැහැ. උදව් කරන්නත් කවුරුවත් නැහැ. එයාලට ලැබෙන කූපන් එකේ වටිනාකම රු.1500.00 යි. මේ වගේ බොහෝ දෙනෙක් ඉන්නවා. මෙවැනි පවුල් තෝරාගෙන ලබාදෙනවා නම් වටිනවා. මෙවැනි පවුල් සඳහා ලබාදෙන මුදල් ප්‍රමාණය වැඩි කර දීම සඳහා සභාව මගින් කටයුතු කළ යුතුයි. ඒ වගේම රු.450.00 ක කූපන්වල වටිනාකම වැඩි කර ගැනීම සඳහා කටයුතු කරන්නේ නම් ඉතාමත් සුදුසුයි.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

මම හිතනවා වැඩිහිටි දීමනාව රු.2000.00 ක් ගෙවනවා කියා. මෙම දීමනාව ලබාගැනීම සඳහා වැඩිහිටි දෙදෙනෙක් අත්වාරුවෙන් තැපැල් කාර්යාලයට අමාරුවෙන් එක්ක එන එක අපිට දකින්න පුළුවන්. එනිසා ගරු මන්ත්‍රී සුරේෂ් කුමාර් මැතිතුමා පවසන පරිදි එම වැඩිහිටි දීමනාව ඔවුන්ගේ ගෙවල් වලට ගිහින් දෙන්න පුළුවන් නම් වඩාත් පහසුකර කාර්යයක් වේවි. එනිසා ඒ පිළිබඳ ලිපි යොමු කරන ලෙසට ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)</u>**

හිටපු මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රතිපාදන වෙන් කිරීම යටතේ රුපියල් ලක්ෂ පහළොවක් වටිනා මහන මැෂින් තොගයක් මට ලැබුණා. ජනතාව වෙත ඒවා බෙදා දී තිබෙනවා. මේ සඳහා ගරු සභාපතිතුමියට මා ස්තුති කළ යුතුයි. අඹගමුව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපති ගරු රාමේෂ්වරන් මැතිතුමා බොහොම අමාරුවෙන් මෙය ලබා දුන්නා. ජීවනෝපාය මාර්ගය උසස් තත්වයට නංවාලීම සඳහා මෙම ප්‍රතිපාදන වෙන්කර දුන් හිටපු මුදල් අමාත්‍ය තුමාට මාගේ ස්තූතිය පුද කරමි. සමෘද්ධි දීමනාව ලබා දියයුතු බොහෝ දෙනෙකුට මෙම දීමනාව ලැබෙන්නේ නැහැ. එකම ගෙදරක කිහිප දෙනෙක් මෙම දීමනාව ලබා ගන්නවා. සමෘද්ධි නිලධාරීන් ගෙන්වා ගෙන සමෘද්ධි කළමනාකරු සමග සාකච්ඡාවක් සංවිධානය කළ යුතුයි. ඇවිදගන්න බැරි වයෝවෘද්ධ අය මෙම දීමනාව ලබාගැනීම සඳහා තැපැල් කාර්යාලයට පැමිණිය යුතු වෙනවා. හොඳ පොහොසත් අයට තමයි සමෘද්ධි දීමනාව ලබා දෙන්නේ. මේ පිළිබඳව අවධානය යොමු කළ යුතුයි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

ගරු මන්ත්‍රී නිත්‍යානන්දන් මැතිතුමා පැවසූ සමෘද්ධි දීමනාව පිළිබඳව සියලුම කොට්ඨාශ වල සේවය කරන සමෘද්ධි නිලධාරීන්ගෙන් නාමලේඛනයක් අපි ඉල්ලා සිටියා. ඒවා ලබා දුන්නේ නැහැ. පසුව අපි තොරතුරු දැනගැනීමේ පනත යටතේ එම නාම ලේඛනය ලබාගත්තා. අදාල අයට මම

නාමලේඛනය ලබාදෙන්නම්. කොට්ඨාසයේ ජීවත් වන සමෘද්ධි දීමනාව ලබා දිය යුත්තේ කාටද, ලබා නොදිය යුත්තේ කාටද කියන එක දැනගන්න පුළුවන්. අනිවාර්යයෙන්ම අපි ලබා දිය යුතු අයගේ නාමලේඛනය යොමු කරමු. මේ සඳහා නිවැරදි තීරණයක් ලබා දෙන බවට ප්‍රාදේශීය ලේකම් ඊයේ මට පැවසුවා. කාට කාටද රු.450.00 ක් වටිනා කූපන් පත් ලබා දී තිබෙන්නේ කියා ඔබ තුමන්ලත් තොරතුරු රැස් කරන්න.

**<u>ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා (ලං.ක.කො)</u>**

කූපන් වැඩි කළ යුතුයි. සුදුසුකම්ලත් නිවැරදි ප්‍රතිලාභීන්ට මෙය ලබාදිය යුතුයි. ඒ වගේම මේ රු.450.00 ක කූපන් පත් අනිවාර්යයෙන්ම වැඩි කළ යුතුයි. මේ සඳහා සභාව මගින් කටයුතු කළ යුතුයි.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

සභාව මගින් මෙම කාරණාව පිළිබඳව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සතුටුයි. රු.450.00 ක් වටිනා කූපන් පතක් තිබෙන බවට ඉහළ තැන්වලට යොමු කළ යුත්තේ බැංකු කළමනාකරු සහ නිලධාරීන් තමයි. අනෙකුත් කූපන් පත් වල වටිනාකම වැඩිකර මේ ප්‍රමාණය පමණක් වැඩි නොකිරීම ඒ අයගේ වරදක්. එක්තරා ග්‍රාම නිලධාරී කොට්ඨාශයක කූපන් පතක් කපා අවලංගු කරන අවස්ථාවේදී එම කූපන් පත එකී ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාශයේම සිටින තවත් දුප්පත් කෙනෙකුට ලබා දෙනවා නම් එය පිළිගත හැකියි. නමුත් එය කපා අවලංගු කර වෙනත් ස්ථානයකට ලබාදීම ගැටලුවක්. රජය විසින් කුමන හෝ සහනදායි වැඩපිළිවෙළක් ලබාදුන්නත් දරිද්‍රතා මට්ටමෙන් පහල ජීවත්වන සමෘද්ධි ප්‍රතිලාභීන් වෙත තමයි පළමුව ලබා දෙන්නේ. නමුත් ඊටත් වඩා දරිද්‍රතා මට්ටමෙන් පහළ ජීවත්වෙන බොහෝ දෙනෙක් සිටිනවා. ජනතා නියෝජිතයින් වන අපට ක්ෂේත්‍රයට ගිහින් දරිද්‍රතා මට්ටමින් පහළ ජීවත්වන අයගේ නාම ලේඛනයක් සකස් කර ගන්න පුළුවන්. එම ලේඛනය අප විසින් එම තොරතුරු ප්‍රාදේශීය, දිස්ත්‍රික් ලේකම්වරුන් සහ සමෘද්ධි කළමනාකරුවන් වෙත යොමු කළොත් ඔවුන් ඒවා පරිශීලනය කළ යුතුයි. ඔවුන් ඒවා පරිශීලනය නොකරන අවස්ථාවලදී මහජන නියෝජිතයින් වශයෙන් අපට ඒ පිළිබඳව කටයුතු කරන්න සිදුවෙනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

කොට්ඨාශයේ ඉන්න අයට තමයි කාට කාට ද රු.450.00 ක කූපන් තිබෙන්නේ කියා දැනගත හැකි වන්නේ. නාමලේඛනය ලබා ගතහොත් තමයි යමක් කරන්න පුළුවන්.

**<u>ගරු මන්ත්‍රී ඒ.රවින්ද්‍රරාජා මැතිතුමා (එ.ජා.ප)</u>**

සමෘද්ධි කාරණාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමිය ඉදිරිපත් කළ කරුණු අගය කළ යුතුයි. ඒ සම්බන්ධයෙන් තොරතුරු දැන ගැනීමේ පනත යටතේ තොරතුරු ලබා ගැනීමත් හොඳ දෙයක්. ඒ ඒ කොට්ඨාශවල මන්ත්‍රීවරුන් හරහා මෙම තොරතුරු ලබා ගැනීම වඩාත් සුදුසුයි. කොට්ඨාශයේ මන්ත්‍රීවරුන් සමග තමයි ප්‍රදේශයේ ජනතාවට කිට්ටු සම්බන්ධතාවයක් තියෙන්නේ. මාගේ කොට්ඨාශයේත් සමෘද්ධි ප්‍රතිලාභීන් සිටිනවා. පොහොසත් පවුල්වල අයත් මෙම ප්‍රතිලාභය ලබා ගන්නවා. අඩු ආදායම්ලාභීන්, වයෝවෘද්ධ අය, ස්වාමිපුරුෂයා නොමැති කාන්තාවන් ආදි අයට ප්‍රමුඛතාවය ලබාදිය යුතු බවට කාරණාවක් තිබෙනවා. නමුත් එසේ සිදු වෙන්නේ නැහැ. ඒ ඒ කොට්ඨාශවල කමිටු ස්ථාපනය කර, ඒ සඳහා සභාපතිවරයෙකුත් පත්කර ගන්නවා._සමෘද්ධිය මගින් ලැබෙන ප්‍රතිලාභ ජනතාවට ලබාදීම සඳහා සමෘද්ධි නිලධාරීන් ක්‍රියාත්මක විය යුත්තේ එම සභාපති මගිනුයි. එම සභාපතිවරුන් තමන්ට අවශ්‍ය පුද්ගලයන්ට ලබා දීම වැඩි වශයෙන් දක්නට තිබෙනවා. සමෘද්ධි ප්‍රතිලාභ ලබා ගන්නා ප්‍රතිලාභීන්ට කියනවා කාටත් දන්නැතුව බැංකුවට එන්න කියලා. මාස තුනකට සැරයක් තමයි එම දීමනාව ලබාදෙන්නේ. මාසිකව රු.2500.00 ක් ලබා ගන්නා

කෙනෙකුට මාස තුනකින් රු.7500.00 ක් ලබා ගත හැකියි. නමුත් රු.5000.00 ක් ලබා ගෙන ඉතිරි රු.2500.00 ක් බැංකු ගිණුමේ රඳවා තැබිය යුතුයි. තමන්ගේ මුණුපුරන්ට බැංකු ගිණුම් විවෘත කළ යුතු බවට කියනවා. අඩු ආදායම්ලාභීන්ට තමයි මෙම සහන ලබා දෙන්නේ. ඒකත් නිවරැදිව ලබා නොදෙන්නේ නම් ඒක අවශ්‍ය නැහැ. ප්‍රතිලාභීන්ට සම්පූර්ණයෙන්ම මෙම ප්‍රතිලාභය ලබා දීම සඳහා කටයුතු කර දෙන ලෙසට ඉල්ලා සිටිමි. වයස අවුරුදු 70 ට වඩා වැඩි අයට රු.2000.00 ක දීමනාවක් ලබාදීම සම්බන්ධව මීට මොහොතකට පෙර ගරු මන්ත්‍රීවරුන් පවසා සිටියා. 2019 වර්ෂයේ 03 වන සභා වාරයේදී මම මෙය යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කළා. එම වැඩිහිටි අය මීට පෙර ගාඩ්මෝර් එකේ සිට පැමිණීම සඳහා ත්‍රීරෝද රථ වලට රු.1500.00 ක් ගෙවිය යුතුයි. මේ අයට ලබා දෙන රු.1900.00 කින් රු.1500.00 ක් ත්‍රීවීල් රථයට ගෙවලා ඉතිරි රු.400.00 න් පාන් සහ එළවළු රැගෙන ගිය තත්ත්වයක් තිබුණා. සෑම කොට්ඨාශයකටම තැපැල් සේවා නිලධාරීන් සිටිනවා. එම සේවකයින් මගින් මෙම දීමනාව ගෙවිය යුතු බවට අපි තීරණයක් ලබා ගෙන තිබුණා. අදාල ආයතන වලට ලිපි යොමු කළ යුතු බවටත් තීරණයක් ලබාගෙන තිබුණා. මෙතෙක් එය සිදු වූයේ නැහැ. නැවතත් එම යෝජනාව ඉදිරිපත් වෙලා තිබෙනවා. දැන්වත් මේ සඳහා තීරණයක් ලබා දිය යුතුයි.

**<u>ගරු මන්ත්‍රී එස්.ඒ.දිසානායක මැතිතුමා (ශ්‍රී ලං.පො.පෙ)</u>**

ගරු සභාපතිතුමියනි, සමෘද්ධි ප්‍රතිලාභී පවුල් සම්බන්ධව කතා කරන විට කිව යුතුයි, මස්කෙළිය නගරයේ සමෘද්ධි ප්‍රතිලාභී පවුල් තෝරන අවස්ථාවේ මමද එම ස්ථානයේ සිටියා. සමෘද්ධි බැංකුව හරහා විශාල ණය මුදල් ලබා දෙනවා. ඒ කියන්නේ ලක්ෂ තුන, ලක්ෂ එක හමාර, ලක්ෂයේ වැනි ණය මුදල්. සාමාන්‍යයෙන් එය නගරයේ සිටින අය සඳහා ලබා දෙනවා. මම හිතන්නේ ගෑස් ලිප්, ගෑස් ටැංකි පවා ලබා දී තිබෙනවා. එය නගරයේ සිටින අය සඳහා පමණයි මෙවැනි ප්‍රතිලාභ ලැබෙන්නේ. අපගේ වතු ආශ්‍රිතව සිටින අයට මේ දේ ලැබෙන්නේ නැහැ. මස්කෙළිය නගරයේ තිබුණු සමෘද්ධි වෙළඳපොලක් සඳහා ඔබතුමිය හා මම නෝර්වුඩ් වල දී සහභාගී වූවා. සෑහෙන දුරට ඒ අය සඳහා ව්‍යාපාර දියුණු කර ගැනීම සඳහා මෙවැනි ප්‍රතිලාභ ලබා දී තිබෙනවා. නමුත් මෙහි විශාල ගැටළුවක් ලෙස බලපාන්නේ නිලධාරීන්ගේ ගැටළුවයි. මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට ඔහු සමෘද්ධි සමාජයක් සාදාගෙන, එම වත්තේ එකී සමාජයයි තීන්දු තීරණ ලබා ගන්නේ. ඔබට සමෘද්ධිය ලබා ගැනීමට අවශ්‍ය නම් රු. 2000.00 ක් දුන්නා නම් ඔහු සමෘද්ධි ප්‍රතිලාභියෙක් හැටියට ගණන් ගනු ලබනවා. නිලධාරීන්ගේ වැරැද්ද නිසා තමයි ලැබිය යුතු කෙනාට නොලැබෙන්නේ. එනිසා ලැබිය යුතු කෙනාට නොලැබෙන්නේ කෙලෙසද කියා සොයා ගැනීම සඳහා එතැනිනුයි අපි මෙය ආරම්භ කළ යුත්තේ. ගරු සභාපතිතුමියගෙන් මා ඉල්ලා සිටින්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවැත්වෙන කමිටු රැස්වීම් වලදී මෙම ගැටළුව ගැන පවසා එහි නිලධාරියෙක් හරහා පැමිණෙන්න. එම කොට්ඨාශයේ සමෘද්ධි නිලධාරියෙක් පිට ගමකින් පැමිණ මෙහි රාජකාරී කරන විට ඔහු දන්නේ නැහැ මෙහි තිබෙන අඩුපාඩු. ඔහු අර සමාජයේ සිටින නායකයන්ගෙන් තමයි මෙහි ප්‍රශ්න පිළිබඳව විමසා සිටින්නේ. පසුව මන්ත්‍රීතුමා පැවසූ පරිදි හිතවත් ඥාතීන්ගේ රැල්ලට තමයි ලබා දෙන්නේ. මේ මස්කෙළිය නගරයේත් කඩ තිබෙන මිනිසුන්ට සමෘද්ධිය තිබෙනවා. අවශ්‍ය අයට එය සිදු කරනවා. දැනටත් එය සිදු වෙනවා. සමහර නිවෙස්වල දෙදෙනෙකුට සමෘද්ධිය තිබෙනවා. වැඩිහිටි දීමනාවත් තිබෙනවා. නැතිකෙනාට නැහැ. එලෙසයි සිදු වන්නේ. එනිසා ඒ කරුණු ඉදිරිපත් කර එතැනින් නිලධාරියෙකු ගෙන්වා ඔබතුමිය පැවසූ පරිදි ඒ ඒ කොට්ඨාශවල ඇති තොරතුරු ලේඛනයේ තිබෙන නම්වලින් සමෘද්ධිය ලබාදීම සඳහා සුදුසුද යන්න සොයා බලා මෙය සිදුකළ හොත් මෙම ගැටළුව අවසන් කළ හැකි බව මම සිතනවා.

**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**

ගරු මන්ත්‍රී නිත්‍යානන්දන් මැතිතුමා හිටපු මුදල් අමාත්‍යතුමා ලබාදුන් වැඩසටහන සඳහා ස්තුති කර තිබුණා. එම වැඩසටහනේ ආරම්භක පියවරක් වශයෙන් වැඩසටහන ආරම්භ කරන්න කීවා. අපි වැඩසටහන අවසන් කර දුන්නා. නමුත් ඒ සඳහා වූ ගෙවීම් සිදු කලේ නැහැ. සභාව මගිනුයි මේ වැඩසටහන මෙහෙයවීම සිදු කළේ. මෙම කාරණාව යටතේ අපි විශාල අසීරුතාවයකට පත් වී සිටිනවා. එනිසා මෙම කාරණාවත් ප්‍රාදේශීය සංවර්ධන කමිටු සභාපතිතුමාගේ අවධානය පිණිස ඔබතුමිය යොමු කළ යුතුයි. මේ සඳහා අවශ්‍ය භාණ්ඩ ලබා දීමට එතුමාට හැකිනම්, මේ සඳහා වූ ගෙවීම් ලබා දිය නොහැකි වූයේ ඇයි? එනිසා මෙම කාරණාව පිළිබඳව වහාම කටයුතු කළ යුතුයි.

**ගරු මන්ත්‍රී කේ.යෝගේන්ද්‍රන් මැතිතුමා (එ.ජා.නි.පෙ)**

මස්කෙළිය නගරයට සමෘද්ධි බැංකු ශාඛාවක් ලබා දිය යුතු බවට පසුගිය සභා වාරවල දී ගරු මන්ත්‍රීවරුන් ඉල්ලා සිටියා. මස්කෙළිය නගරයේ මෙම බැංකුව ක්‍රියාත්මක වෙනවාද? නැද්ද? යන එක ප්‍රශ්නාර්ථයක්. හේතුව පසුගිය 28 වැනි දින මරේ, සීතගඟුල, මවුස්සාකැලේ වැනි ප්‍රදේශවල ජනතාව සමෘද්ධි දීමනාව ලබාගැනීම සඳහා බොහෝ දුෂ්කරතා මැද්දේ පැමිණියා. මෙම යෝජනාව සමඟ මස්කෙළිය සමෘද්ධි බැංකු ශාඛාව පිළිබඳවද ගරු සභාපතිතුමිය අවධානය යොමු කළ යුතු බවට ඉල්ලා සිටිමි.

**ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

මාස පහකට පෙර මස්කෙළිය නගරයේ සමෘද්ධි බැංකු ශාඛාව ආරම්භ කළා. නිළධාරීන් හතර පස් දෙනෙක් පැමිණ යනවා. බැංකුව ගොඩනැගිල්ලක් වශයෙන් පමණක් පවතිනවා.

**ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා (ලං.ක.කො)**

ගරු මන්ත්‍රී පී. ආනන්දන් මැතිතුමා පැවසූ පරිදි මමත් හැමිල්ටන් වතුයායේ ලක්ෂ හතරක් වටිනා කොන්ක්‍රීට් මාර්ගයත් සකස් කර තිබෙනවා. වාලමලේ කෝවිලට ආරක්ෂිත වැටක් සකස් කළා. පසුගිය වසරේ දෙසැම්බර් මාසය වන විට මෙම වැඩසටහන් අවසාන කළා. ඒ සඳහා වූ මුදල් මෙතෙක් ලැබිලා නැහැ. මේ පිළිබඳව ප්‍රාදේශීය ලේකම් සමග සාකච්ඡා කළ අවස්ථාවේදී හැකි ඉක්මනින් ඒ සඳහා වූ මුදල ලබා දෙන බවට පැවසුවා.

**ගරු මන්ත්‍රී එස්.ඒ.දිසානායක මැතිතුමා (ශ්‍රී ලං.පො.පෙ)**

මම හිතන්නේ සමෘද්ධි බැංකුව විවෘත කර ඒ සඳහාත් මාසික කුළියක් ගෙවනවා. එයටත් සමෘද්ධි අධිකාරියට ලිපියක් ඉදිරිපත් කරන්න. තව එකක් තිබෙනවා, අපි පසුගිය වසරට පෙර වර්ෂයේ, කොට්ඨාශයකට ලක්ෂ විස්සක මුදලක් වෙන්කර සිටියා. එවිට අපි ලක්ෂ විස්සක බිල්ඩිමක් ඉහළ සාදා තිබෙනවා. බිල්ඩිමේ එම ස්ථානය සඳහා කුළිය ලබා දෙනවානම් ඒ සමෘද්ධි බැංකුව හරහා එතැනට යම්කිසි මුදලක් යටකළ හොත් සමෘද්ධි බැංකුවක් හෝ එතැනින් විවෘත කර ගත හැකියි. එතැනින් මුදල් නිකරුණෙයි යන්නේ. සේවයක් නැහැ. මුදලුත් නැහැ. එනිසා ගරු සභාපතිතුමියනි, ඔබතුමිය ඒ සම්බන්ධයෙන් එම ආයතනයට අදාලව ලිපි ඉදිරිපත්කර සභාවේ මේ පිළිබඳව යෝජනා ඉදිරිපත් ඇති බවට දැනුවත් කරන්න. මහජනතාවගේ මුදල්. බිල්ඩිමේ සම්පූර්ණ ඩැඩ ඉවරයි. දැන් තිබෙන්නේ දොරවල් ටික හා ජනෙල් ටික දැමීමට පමණයි. ඒ අය මාසිකව කුළියක් ගෙවනවා නම් ඒ සඳහා අත්තිකාරම් මුදලක් ගෙවනවානේ. එයින් එය සාදා එතැන එම මහජනතාව වෙනුවෙන් එහි සිටිය හැකියි. එවිට එම ස්ථානයේ නිලධාරියෙක් සිටිනවානේ.

**<u>ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**

අපි මේ රු.450.00 ක කූපන් පත පිළිබඳව කතා කර සිටිනවා. ඒ වගේම ආබාධිත අය සඳහා රු.300.00 ක රු.350.00 ක දීමනාව පමණයි ලබා දෙන්නේ. ඉන් කිසිදු ප්‍රයෝජනයක් නැහැ. එනිසා මේ පිළිබඳව දිස්ත්‍රික් ලේකම්ට හෝ මුදල් අමාත්‍යාංශය වෙත දැනුම් දිය යුතුයි. හෘද රෝගීන්ට ලබා දෙන දීමනාව රු 150.00 යි. මේ සියල්ල වැඩි කළ යුතුයි.

**තීරණ අංක 09**

රු 450.00 ක් වටිනා සමෘද්ධි කූපන් පත් පිළිබඳ වූ යෝජනාවට අනුව ප්‍රාදේශීය / දිස්ත්‍රික් ලේකම්වරුන්ට ද සමෘද්ධි අධිකාරිය සහ සමෘද්ධි කළමනාකරුවන්හට ද ලිපි යොමු කිරීමට තීරණය කරන ලදී.

**තීරණ අංක 10**

වැඩිහිටි දීමනාව තැපැල් සේවකයන් මගින් බෙදා හැරීම සඳහා අවශ්‍ය ආයතන වෙත ලිපි යොමු කිරීමට තීරණය කරන ලදී.

**තීරණ අංක 11**

සමෘද්ධි බැංකු ගොඩනැගිල්ල සම්බන්ධයෙන් සමෘද්ධි අධ්‍යක්ෂ ජෙනරාල්තුමාට ලිපියක් යැවීමට තීරණය කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා (ලං.ක.කො)</u>**

පසුගිය මාස හතරක් පහක් තිස්සේ ජනතාව අති විශාල ආර්ථික ගැටළු වලට මුහුණ දෙමින් සිටිනවා. තවමත් පෝලිම්වල සිටිනවා. පසුගිය මාසයේ 19 වන දින මස්කෙළිය නගරයේ පිහිටි ඉන්ධන පිරවුම්හලට භූමිතෙල් ලබා ගැනීම සඳහා අති විශාල ජනතාවක් පැමිණ සිටියා. එහි සිටි තරුණයින් නිසා එම ස්ථානයේ විශාල අර්බුධකාරී තත්ත්වයන් මතු වුණා. මස්කෙලිය නගරය ග්‍රාම සේවා වසම් 13 කට පොදු ස්ථානයක්. නගරයේ සිටින ජනතාව වතුකරයේ ජනතාව ඉතාමත් පහත් මට්ටමකින් හසුරවනවා. එනම් “වත්තේ එවුන් කියා” ආමන්ත්‍රණය කර තිබෙනවා. මගේ අම්මයි තාත්තයි වත්තේ වැඩ කරපු අය තමයි, මමත් වැඩ කරන්නේ වත්තේ. ජනතාව විසින් ඡන්දය ලබාදී පසුගිය මාස හතරක් පහක් ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී වශයෙන් කටයුතු කරනවා. එම අවස්ථාවේදී පහත් විදියට කතා කර තිබෙනවා. වතුකරයේ ජීවත්වන අයත් මෙම නගරයේ ව්‍යාපාරිකයින් වශයෙන් සිටිනවා. වත්තේ එවුන් කියා බැනපු එක මම පිළිකුලෙන් හෙළා දකිනවා. සමාජ මාධ්‍ය ජාල ඔස්සේ ඉතාමත් පහත් විදියට සටහන් කර තිබුණා. මේවා මම දැඩි ලෙස හෙළා දකිනවා. වතුකරයේ අය කිසි හෙයකින් පහත් මිනිසුන් නොවේ. නගරයේ ජීවත් වන මිනිසුන්ට සමානව වතුකරයේත් ජීවත් වෙනවා. ඉදිරි කාලයේ දී මෙවැනි තත්ත්වයන් සිදු නොවිය යුතුයි. සිදු වූ මෙවැනි සිද්ධිය සඳහා මම සභාව මගින් දැඩි විරෝධය පලකර සිටිනවා. මේ පිළිබඳව බොහෝ දෙනෙක් තමන්ගේ විරෝධතාවය පල කරන බවට පවසා තිබෙනවා. අපිත් මේ වගේ කරන්න හොඳ නැහැ කියා මම ඒ අයට පැවසුවා. මම හිතලා තිබුණා නම් මස්කෙළිය නගරයේ විශාල උද්ඝෝෂණයක් සිදු කරන්න තිබුණා. බොහෝ දෙනෙක් මට සහාය පළ කිරීමට සූදානම්ව සිටියා. නමුත් මම එසේ කළේ නැහැ. ඉදිරි කාලයේ දී පොදු ස්ථානවල ඉතාමත් ප්‍රවේශමෙන් කතා කළ යුතුයි.

**ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**

ගරු මන්ත්‍රී කේ. නිත්‍යානන්දන් මැතිතුමා "වත්තේ එවුන්" කියා කතා කළ එකට හිතේ වේදනාවක් ඇති වූ බවට පැවසුවා. නමුත් ඒ පිළිබඳව විමසිල්ලෙන් බැලුවහොත් වනාන්තර වතු බවට පත් කළේ අපි තමයි. අද අපට ලැබී තිබෙන පහසුකම් නගරයේ ජීවත්වෙන ජනතාවට නැහැ. අද වන විට සහල් පමණක් ලැබුණොත් වතුකරයේ ජනතාවට ප්‍රමාණවත් වෙනවා. අදට භූමිතෙල් වලටත් ගෑස්වලටත් නගරයේ මිනිස්සු තමයි පෝලිම්වල ඉන්නේ. වතුකරයේ ජනතාව එම පෝලිම් වල නැහැ. අපි දැනට වතුකරයේ ජීවත් වුණත් ඉතාමත් සතුටින් ජීවත් වෙනවා. අපට එහි සියලුම දේවල් නොමිලේ ලැබෙනවා. වතු ප්‍රදේශයට පැමිණ බැලුවහොත් තේරුම් ගන්න පුළුවන්, මේ වගේ සුඛෝපභෝගී ජීවිතයක් තියෙනවද කියලා. අද නගරයේ ජීවත් වෙන මිනිස්සු කෑම වේලක් කන්න අඩිතාලම වී සිටින්නේ අපි තමයි. එනිසා නගරයේ සිටින අය මෙවැනි වචන භාවිතා කිරීමෙන් වලකින්න. අපි ඔබව විවේචනය කිරීමේ කාලය වැඩි ඈතක නැහැ. දැන් මස්කෙළිය ප්‍රාදේශීය සභාව ක්‍රියාත්මක වන්නේ නම් ඊට හේතුව වතුකරයේ ජනතාව තමයි. වතුකරයෙන් ආවරණය වන කොට්ඨාශ නවයක් තිබෙනවා. නමුත් මෙම සභාවේ සම්පූර්ණ ප්‍රතිලාභ ලබා ගන්නේ නගරයේ ජීවත්වන අය පමණයි. මෙම සභාවට වතුකරය නියෝජනය කරමින් මෙතෙක් යම් පැමිණිල්ලක් ඉදිරිපත් වී තිබෙනවාද? අපි ගොස් ඒවා පරීක්ෂාකර තිබෙනවාද? එනිසා මෙවැනි දේවල් මම ඉතා දැඩි ලෙස හෙළා දකිනවා.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

මම හිතන විදිහට "වත්තේ එවුන්' කියන එක අපහාසයක් නොවෙයි. ඒක අපේ අනන්‍යතාවයක්. මෙහි සිටින සියලුම දෙනා වතු ප්‍රදේශයේ අය තමයි. මස්කෙළියේ ජාති ආගම් භේදයක් කියලා එකක් නැහැ. මස්කෙළියේ එහෙම එක් අයෙක් දෙදෙනෙක් කතා කර ඔවුන්ට දඬුවම්ද ලබා දී තිබෙනවා. මේ ප්‍රශ්නය තවදුරටත් රැගෙන යන්නේ නැතුව මේ සඳහා වූ තීරණය ඒ ඒ අය හරියට ප්‍රයෝජනයට ගත්තා නම් ඇති. ඉන්ධන පිළිබඳව කාරණාවක් ඉදිරිපත් කර තිබුණා. හදිසි අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් ඉන්ධන ලබාදෙන බවට පවසා තිබුණා. නමුත් දැන් සභාපතිතුමියටවත් ඉන්ධන නැහැ. හදිසි අවශ්‍යතා සඳහා ඉන්ධන නැති අවස්ථාවලදී වතුකරයේ ජනතාව ගොඩක් අපහසුතාවයට පත් වෙනවා. හදිසි අවශ්‍යතා සඳහා දුර ඈත වතුකර ප්‍රදේශවල සිට වෛද්‍ය පහසුකම් සඳහා නගරයට පැමිණීමට අවශ්‍යතාවයක් මතු වුවහොත් අපට තිබෙන එකම විසඳුම තමයි 1990. සාමිමලේ ප්‍රදේශයේ හදිසි අවශ්‍යතාවයක් මතු වන විට 1990 වාහනය නල්ලතන්නිය ප්‍රදේශයට ගොස් තිබුණා නම් එම වාහනය මෙම ප්‍රදේශයට ගෙන්වා ගන්න බැහැ. එකම අවස්ථාවකදී දුරකථන ඇමතුම් 03 ක් එන්න පුළුවන්, ඒ අවස්ථාවේදී ඒ අය කුමන ප්‍රදේශයටද යන්නේ කියන ගැටළුවක් මතුවෙනවා. එක වත්තක ත්‍රිරෝද රථ දෙකකට හෝ මෙවැනි හදිසි අවශ්‍යතා සඳහා ඉන්ධන ලබා දෙන්නේ නම් හදිසි අවශ්‍යතා වලදී එය පහසුවක් වේවි. මමත් මේ පිළිබඳව යෝජනාවක් ඉදිරිපත් කර තිබුණා. මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර තීරණයක් ලබා ගැනීමට අදහස් කරනවා. හදිසි අවශ්‍යතාව පිළිබඳව සැලකිල්ලට ගනිමින් මෙම කරුණු පැහැදිලි කර ප්‍රාදේශීය ලේකම් වෙත ලිපියක් යොමු කරන්න.

**ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)**

මෑතකදී ස්ටොක්හෝම් කොට්ඨාශයේ එකම දවසේ දෙදෙනෙක් අසනීප වී රෝහලට රැගෙන යාමේ අවශ්‍යතාවයක් මතුවුවා. ඉන් එක් අයෙක් මරණයට පත් වුණා. ඒ වගේම වෙනත් ප්‍රදේශයක සිට බ්ලූම්ෆීල්ඩ් ප්‍රදේශයට පැමිණ සිටි එක් අයෙකුත් මරණයට පත්වුණා. යම් අනතුරක් සිදුවීමට පෙර අපි පෙර සූදානම්ව කටයුතු සිදු කරගෙන සිටිය යුතුයි. මෙවැනි තත්ත්වයක් තව කොච්චර

කාලෙකට පවතී ද කියා දන්නේ නැහැ. මම අපේ වතුයායේ වතු අධිකාරී සමඟ සාකච්ඡා කර එක කොට්ඨාශයකට එක් ත්‍රීරෝද රථයක් හදිසි අවශ්‍යතා සඳහා සූදානම් කර තියන ලෙසට ඉල්ලා සිටියා. ඒ සඳහා ඔහු සහයෝගය ලබා දී තිබුණා. නමුත් කොට්ඨාශයේ සිටින වාහන අයිතිකරුවන් එය පිළිගත්තේ නැහැ. ඒ සඳහා වූ ගෙවීම් ප්‍රමාද වීම ඊට හේතුවයි. නැවතත් සිහිකැඳවීමේ ලිපියක් වතු අධිකාරි වෙත මම යොමු කළා. මේ වගේ සියලුම කොට්ඨාශවල ගරු මන්ත්‍රීවරුන් යම් සූදානමක් සිදුකල යුතුයි. එලෙස සූදානම් කළහොත් මෙම ගැටළුවට සුදුසු විසඳුමක් ලබාගත හැකියි.

**<u>ගරු මන්ත්‍රී ඒ.රවින්ද්‍රරාජා මැතිතුමා (එ.ජා.ප)</u>**

ගාඩ්මෝර් කියන්නේ මස්කෙළියෙ සිට ඈත ප්‍රදේශයක පිහිටා තිබෙන වත්තක්. අත්‍යවශ්‍ය සේවා සඳහා ඩිපෝව මගින් ඉන්ධන ලබාදෙන බවට රජය ප්‍රකාශ කර තිබෙනවා. නමුත් අපේ ගාඩ්මෝර් ප්‍රදේශයේ බස් රථයක් මේ සතියේ ගියවිට ඉන්ධන ලබා ගෙන නැවත සතියකට පසුවයි නැවත පැමිණෙන්නේ. රජයේ ඩිපෝවක් මගින් ඉන්ධන ලබා ගැනීමේදී රජයේ වාහන වලට දිනපතා ඉන්ධන ලබා ගත හැකියි. අනෙකුත් රජයේ වාහන සුපුරුදු පරිදි සේවයේ යෙදෙනවා. අපගේ ගාඩ්මෝර් ප්‍රදේශයට සේවාවේ යෙදෙන රජයේ බස් රථයත් දිනපතා සේවාවේ යෙදෙන්නේ නැහැ. පසුගිය සතියේ එක්තරා කාන්තාවකට වත්තේ දී බඹරු දෂ්ඨ කළ නිසා ඇයව රෝහලට රැගෙන ආවේ කුයින්ස්ලෑන්ඩ් වත්ත හරහා පිහිටි අඩි පාරේ. එම ප්‍රදේශයේ කිසිදු වාහනයක් සතුව ඉන්ධන තිබුණේ නැහැ. වතු පරිපාලනයත් වෛද්‍ය සේවාව අවම කර තිබෙනවා. රජයේ සේවාව ලබාදෙන මෙම බස් රථය හෝ දිනපතා සේවයේ යොදවනවානම් පහසු වේවි. ගාඩ්මෝර් ප්‍රදේශයේ සේවයේ යෙදෙන වාහන වලට පිළිවෙලකට ඉන්ධන ලබා දිය යුතුයි. එසේ නොමැති නම් රජයේ සේවාව විධිමත්ව ලබා දිය යුතුයි. ඇහුවොත් ටයර් නැහැ කියනවා. ටයර් තියෙන වාහනවලට ඉන්ධන ලබා දුන්නා නම් එම වාහන සේවයේ යෙදෙනවා නේද? අපි මේ සඳහා වහාම තීරණයක් ලබා ගත යුතුයි. මගේ කොට්ඨාශයේ පවුල් 4000 ක් 5000 ක් පමණ සංඛ්‍යාවක් ජීවත් වෙනවා. මම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක්. මා ළඟ වෑන් රථයක් තිබෙනවා. අත්‍යාවශ්‍ය සේවාව සඳහා සභාව මගින් ඩිපෝව වෙත ලිපියක් ලබා දෙන්නේ නම් මගේ කොට්ඨාශයේ අත්‍යවශ්‍ය සේවා සඳහා මගේ වාහනය යොදාගත හැකියි. අවුරුදු 15 කට මගේ වාහනය මගින් අවස්ථා 1000 කට වැඩිය වෛද්‍ය සේවාවන් වලට උදව් කර තිබෙනවා. මෙවැනි සේවාවන් ලබා දී තිබෙනවා. කුමක් හෝ හදිසි අවශ්‍යතාවයන් සඳහා මට තමයි දුරකථන ඇමතුම් ලබා දෙන්නේ.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)</u>**

මාගේ කොට්ඨාශයේ අත්‍යවශ්‍ය සේවාවන් වල යෙදෙන වාහන හතරකට ප්‍රාදේශීය ලේකම් සමග සාකච්ඡා කර මම ඉන්ධන ලබා දී තිබෙනවා. ඒ වගේම ඉන්ධන සම්බන්ධයෙන් බොහෝ අක්‍රමිකතා සිදු වෙනවා. අපගේ ගරු මන්ත්‍රිතුමා පවසන පරිදි ගාඩ්මෝර්, මරේ වැනි ප්‍රදේශවලට අනිවාර්යයෙන්ම රජයේ බස් සේවාව ලබා දිය යුතුයි. ඒ නිසා මේ පිළිබඳව අවශ්‍ය ස්ථානවලට ලිපි යොමු කරන්න. කෘෂිකර්ම කටයුතු වල යෙදෙන පුද්ගලයින් හට ඉන්ධන ලබා දෙන ලෙසට පවසා තිබුණා. නමුත් එය මස්කෙළිය ඉන්ධන පිරවුම් හලෙන් ප්‍රතික්ෂේප කළා. එනිසා මින් ඉදිරියේ දී මෙවැනි අත්‍යවශ්‍ය සේවා සඳහා ප්‍රමුඛතා ලබාදිය යුතුයි. මස්කෙළියට ලැබෙන ඩීසල් තොගය කොහෙද කියලා දන්නේ නැහැ. මෙම ප්‍රදේශයේ බස් රථ සඳහා ස්ථිර ගාස්තුවක් නිර්ණය කරන ලෙසට මධ්‍යම පළාතේ පෞද්ගලික බස්රථ කොමසාරිස් වෙත දැන්විය යුතුයි.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)</u>**
මැතකදී අපි විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපති සහ අනෙකුත් නිලධාරීන් සමඟ රැස්වීමක් සංවිධානය කර තිබුණා. එම රැස්වීමේදී අළුතෙන් ඉදිකල විවිධ සේවා සමුපකාර ශාඛාවලට භූමිතෙල් ලීටර් 200 ක් ලබාදෙන බවට පැවසුවා. නමුත් එය ක්‍රියාත්මක වුණේ නැහැ. මෙය විශ්වාස කරමින් අපි ජනතාවටද පොරොන්දු වුණා. නැවතත් මේ පිළිබඳව සිහිකැඳවීම් සිදු කළ යුතුයි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මම එම ස්ථානයට ගොස් ඒ සඳහා සහභාගිවෙලයි පැමිණියේ.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
අසාමාන්‍ය තත්ත්වය හේතුකොටගෙන වාහනවල රියදුරන් අපහසුතාවට පත් වී සිටිනවා. මෙය අවස්ථාවක් කර ගනිමින් වාහනවල ගාස්තු ඔවුන්ට අවශ්‍ය පරිදි වැඩි කරගැනීම වැරදි කාර්යයක්. මරේ කොට්ඨාශයේ වලදල, ගැටස්, රාජමලේ වැනි ප්‍රදේශ ඉතාමත් අසීරු තත්වයක පවතිනවා. එක ශිෂ්‍යයෙකුට වලදල සිට මස්කෙළියට පැමිණ යන්න දිනකට රුපියල් 400.00 ක් වියදම් වෙනවා. සිසුන් පාසලට පැමිණීම අඩුයි. සිසුන් වෙනත් පාසල්වලට දාගන්න දෙමව්පියෝ ඇවිත් කතා කරනවා. වාර ප්‍රවේශ පත්‍ර ලබා දීම සඳහා පෞද්ගලික ප්‍රවාහන සේවාවට ඉල්ලීමක් ලබාදෙන්න.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
ප්‍රවාහන අංශයට ලිපි යොමු කළාට ඔවුන් එන දිනය කෙසේ හෝ දැනගන්නවා. ඔවුන් පැමිණෙන දිනයේදී පමණක් ටිකට්පත් ලබා දෙනවා. ජනතාවත් මේ ගැන අහන්නේ නැහැ. මධ්‍යම පළාත් ප්‍රවාහන අධිකාරිය විසින් ටිකට් පොත් ද ලබාදී තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
මැතකදී සමාජ මාධ්‍ය ජාල ඔස්සේ ප්‍රසිද්ධ වු සිදුවීම්. මැතක දී ඉන්ධන ලබා දීම පිළිබඳව සියලුම දෙනා කැඳවා රැස්වීමක් පැවැත්වූවා. පොලිස් නිලධාරීන් සමග මටත් මුහුණට මුහුණ තර්ක කිරීමේ තත්ත්වයක්ද උදා වුණා. ඊට පසුවදා භූමිතෙල් ලබා දුන්නා. එදින අලුයම 03.00 ට පමණ මම තවත් කෙනෙක් කැටුව ප්‍රදේශයේ සිටින ගුරුවරුන් සඳහා ගැළුම් 56 යොදවා තිබුණා. එදින සියලුම ගුරුවරුන් එම ස්ථානයට ගොස් සිටින අවස්ථාවේ භාවිතා කළ වචන ඉතාමත් අවිනීතව තිබුණා. 'අපි තමයි කිව්වේ කියන කාරණාව' ඒ අවස්ථාවේදී සමුපකාර සමිතියේ කිසිවෙක් කතා කළේ නැහැ. මෙය සමාජයේ සිදු වූ ඉතාමත් පහත් ක්‍රියාවක් ලෙසටයි දකින්නේ. කිසිම ගරු මන්ත්‍රීවරයෙක් පෝලිම් වලට එන්නේ නැහැ කියලත් පවසා සිටියා. ඉන්ධන අවශ්‍ය වන ගරු මන්ත්‍රීවරුන් පෝලිමේ සිට තමයි ඒවා ලබා ගන්නේ, අවශ්‍ය නැති අය පෝලිමට එන්නේ නැහැ කියලා මම එහිදී කිව්වා. එක්තරා පුද්ගලයින්ට පමණයි සියලුම දේවල් පහසුවෙන් ලැබෙන්නේ. මේ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගන්නේ නම් රාත්‍රී කාලයේදී ඉන්ධන ලබා ගැනීම නවත්වන්න පුළුවන්. ලියාපදිංචි කළ වාහන වල ලේඛනය ලබා දෙන ලෙසට තොරතුරු දැනගැනීමේ පනත යටතේ විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපතිතුමා ගෙන් ඉල්ලන්න. එවැනි ලේඛනයක් නැතිව ඇති. මස්කෙළිය නගරයේ පෙට්‍රල් සහ ඩීසල් අවශ්‍ය නම් කොහෙවත් සොයන්න අවශ්‍ය නැහැ. 'සම්පත්' කඩේ සහ පොලිස් ස්ථානය ඇතුලේ තිබෙනවා. එහිදී ඒවා විකුණනු ලබනවා. මෙහිදී මතුව ඇති ගැටළු වලට මස්කෙළිය පොලිස් ස්ථානයත් අනුබල ලබා දෙනවා. ඒ වගේම මේ බස් ගාස්තු පිළිබඳව ද කටයුතු කළා නම් හොඳයි. කොළඹ සිට හැටන්වලට රු. 600.00 ක් වෙනවා. නමුත් මස්කෙළිය සිට රාජමලේට රු. 450.00 ක් අය කරනවා. ලොකු පාර්සලයක් දැම්මොත් ඒ සඳහා රු. 500.00 ක් අය කර

සිටිනවා. පොඩි ළමුන් ට රු. 100.00 ක් අය කරනවා. මේ සඳහා කටයුතු කරන්න. නැතිනම් දැනට මාර්ගය කාපට් කර ඇති නිසා නව බස් රථයක් සේවය සඳහා ලබාදෙන්න.

**තීරණ අංක 12**
බස්රථ ධාවනය පිළිබඳව මගී ප්‍රවාහන අධිකාරිය වෙත ලිපියක් යොමු කිරීමට තීරණය කරන ලදී.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
මස්කෙළිය නගරයට තවමත් ඉන්ධන ලැබී නැහැ. ඉන්ධන ලැබුණායින් පසුව තමයි මේ පිළිබඳව ගන්නා ක්‍රියාමාර්ග කුමක්ද කියා බැලිය යුත්තේ. ඒ වගේම නගරය දැන් නවීකරණය වී තිබෙනවා නම් ඊට හේතුව වතුකරයේ ජනතාව තමයි. එම ජනතාව භාණ්ඩ මළදී ගත්තේ නැත්නම් නගර වතුවලට වඩා නරක තත්ත්වයකට පත්වෙනවා. උතුරේ අය 'වත්තෙ එවුන්' කියලා හඳපු නම තමයි අදටත් පවතින්නේ. මෙය ආඩම්බරයට කරුණක්. මේ වගේ ජන කොටසකුත් මෙහි ජීවත් වෙනවා නේද. එදා අපි නැතිනම් ලොකු ප්‍රශ්නයක් මතුවෙනවා. ඉදිරියේදී බලමු. අපි සියළු දෙනා එහි සිට පැමිණි අය නේද? වතුකරයේ ජීවත් වෙන බොහෝ දෙනෙක් හොඳ තත්ත්වයෙන් සිටිනවා. නාසා ආයතනයේ ද සේවය කරනවා. ඉන්දියානු තානාපති කාර්යාලයේ ද වත්තේ කෙනෙක් සිටිනවා. මේ සියල්ල ආඩම්බරයට කරුණක්.

**<u>ගරු මන්ත්‍රී ඒ.රවින්ද්‍රරාජා මැතිතුමා (එ.ජා.ප)</u>**
මෑතකදී ශ්‍රී ලංකාවේ රූපවාහිනී වැඩසටහනකදී 'වත්තෙ එවුන්'' කියd පැවසීමෙන් විශාල ආන්දෝලනයක් මතු වී තිබුණා. ඒ අනුව මෑතදී මේ පිළිබඳව ඉන්දියාවේ සමීක්ෂණයක් සිදු කරමින් ලංකාවේ වතුකරයේ දෙමළ ජාතිකයින් පළමු වරට අධ්‍යාපන සහ රැකියා අවස්ථා සඳහා විදෙස්ගත වී ඇති බව සොයාගෙන ඇති බවට එක්තරා නළුවෙක් සඳහන් කර තිබෙනවා. මෙම ආඩම්බරය අප වතුකරයේ ජනතාව සතුයි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**
අනාගතයේ දී මෙවැනි ප්‍රශ්න මතු වුවහොත් එම අවස්ථාවේ දී අපි අවශ්‍ය කටයුතු සිදු කරනවා. මීළඟට ගරු මන්ත්‍රී පී. රාජ්කුමාර් මැතිතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
වතුකරයේ පිහිටි සමුපකාර සමිති ශාඛා ඉහළ මට්ටමෙන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම තුළින් වතුකරයේ ජනතාවගේ ආහාර ප්‍රශ්නයට යම් විසඳුමක් ලබාදිය හැකියි. තවද ප්‍රධාන සමුපකාර සමිතියේ වතුකරයේ ජනතාවට ද සාමාජිකත්වය ලබා දෙමින් කටයුතු කිරීම තුළින් සහන මිලට භාණ්ඩ මිළදී ගැනීමේ හැකියාවක් මතුවීම පිළිබඳ කාරණාව මාගේ යෝජනාවයි. එනම් විවිධ සේවා සමුපකාර සමිති ශාඛා සියලුම වතුවල පිහිටා තිබෙනවා. එහිදී යම්කිසි කාලසීමාවක් තුළ වැටුප අඩු වුව ද එක් එක් මාස සඳහා මුදල් අය කර ගනිමින් ජනතාවට අවශ්‍ය භාණ්ඩ නිකුත් කර සිටිනවා. දැනට වතුවල පිහිටා ඇති බොහෝ සමුපකාර සමිති ශාඛා වලින් මෙම ක්‍රමය අත්හිටුවා තිබෙනවා. සාමාන්‍ය ක්‍රමය යටතේ විවිධ සේවා සමුපකාර සමිති ශාඛා ක්‍රියාත්මක වීම තුලින් එම ප්‍රදේශයේ ජනතාව ඉන් එල ප්‍රයෝජන ලබා ගන්නවා. දෙවන කාරණාව වශයෙන් මෙම විවිධ සේවා සමුපකාර සමිතියේ වතු ජනතාවගේ සාමාජිකත්වය අඩු බවට පවසනවාට වඩා එම සාමාජිකත්වය පිළිගැනීමේ ආකල්පයක් සමුපකාර සමිතියට නැති බව ප්‍රකාශ කළ යුතුයි. සභාපතිතුමියටත් එම සමිතියේ සාමාජිකත්වය තවමත් ලබාදී නැහැ. මස්කෙළිය ප්‍රදේශයේ

තවමත් ස.තො.ස ශාඛාවක් පිහිටුවා නැහැ. රජයෙන් ප්‍රකාශිත මිල ගණන්වලට භාණ්ඩ ලබා ගත හැකි එක් ආයතනයක් ස.තො.ස. අනෙක් ආයතනය විවිධ සේවා සමුපකාර සමිතිය. නමුත් සාමාජික ප්‍රමාණය ඉතාමත් අඩුයි. එනිසා සාමාජික ප්‍රමාණය වැඩි කිරීමට කටයුතු කළ යුතුයි. සමුපකාර සමිති සභාපතිතුමා කැඳවා සාමාජිකත්වය ලබාදෙන්නේ කුමන පදනමෙන් ද යන එක පිළිබඳව සාකච්ඡා කරමු. සාමාජිකත්වය ලබා දීමට නොහැකි නම් ප්‍රාදේශීය ලේකම් වෙත පැමිණිලි ලිපියක් යොමු කරන්න. මීළඟ කාරණාව වන්නේ වතුකරයේ පිහිටා ඇති සමුපකාර සමිති නැවත පණ ගැන්වීම සඳහා ප්ලාන්ටේෂන් කළමනාකරු වෙත ලිපියක් යොමු කරන්න. මෙවැනි දේවල් දැනට ක්‍රියාත්මක කිරීම තුළින් ජනතාවට යම් ප්‍රයෝජනයක් ලැබේවි.

**<u>ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා (ලං.ක.කො)</u>**

ගරු මන්ත්‍රීතුමා පැවසූ පරිදි සියලුම වතු වල සමුපකාර සමිති පිහිටා තිබෙනවා. වතු අධිකාරිය උනන්දු වුවහොත් ඒවා ක්‍රියාත්මක තත්වයට පත්කළ හැකියි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

සමහර වතු ප්‍රදේශවල අධිකාරිය විධිමත් පරිදි ක්‍රියාත්මක වෙනවා. සමහර ප්‍රදේශවල පමණයි ගැටළු පවතින්නේ.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

ඉස්සර වතු අධිකාරිය විසින් ජනතාවට මතුවෙන හදිසි අවශ්‍යතා වලදී ප්‍රවාහන පහසුකම් ලබා දුන්නා. දැනට ඒවා නැහැ. එක් එක් ස්ථානවල විවිධ ක්‍රමයට ක්‍රියාත්මක වෙනවා. මෑතදී ලබාදුන් සහන භාණ්ඩ ප්‍රවාහනය පවා අපි කුලිය ගෙවලයි රැගෙන ආවේ. ජනතාවගේ අයිතීන් ප්‍රතික්ෂේප වෙනවා. මස්කෙළිය, කුඩා මස්කෙළිය ආදි ප්‍රදේශ සඳහා වූ සහන භාණ්ඩ මෙතෙක් රැගෙන විත් නැහැ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

මේ පිළිබඳව ලිපි යොමු කර තිබෙනවා.

**තීරණ අංක 13**

ඉහත යෝජනාව පිළිබඳව අදාළ ආයතන වෙත ලිපි යොමු කිරීමට තීරණය කරන ලදී.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

මීළඟට ගරු මන්ත්‍රී වසන්තකුමාර් මැතිතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී වී.වසන්තකුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**

මාගේ යෝජනාව වන්නේ, සාමිමලේ ප්‍රදේශයේ පසුගිය අවුරුදු හතළිහකට වඩා වැඩි කාලයක් පවත්වාගෙන ගිය සමුපකාර සමිති වෙළඳසැල පෞද්ගලිකව පුද්ගලයකුට විකුණනු ලදුව, ඉන් අනතුරුව සාමිමලේ පන්සලට ඉදිරියේ පිහිටා තිබූ ඉඩමේ (LRC) අවුරුදු පහකට පෙර ඉදිකළ සමුපකාර සමිති වෙළඳසැල අක්‍රීය වීමෙන් එය විවිධ සේවා සමුපකාර සමිතිය විසින් වෙනත් පුද්ගලයෙකුට කුලියට ලබා දී ඇත. මේ නිසා සාමිමලේ ප්‍රදේශයේ මහජනතාව නොයෙකුත් දුෂ්කරතාවන්වලට මුහුණ දෙමින් සිටිනවා. ජනතාව මුහුණ දෙන දුෂ්කරතා බලා සිටීමට නොහැකි සාමිමලේ ප්‍රදේශයෙහි ගරු මන්ත්‍රීවරුන් සාමූහිකව එක්වී සමුපකාර වෙළඳසැලක් ආරම්භ කළ යුතු යැයි තීරණය කර විවිධ උත්සාහයන් වල යෙදී අද දින එනම් 2022.06.08 දින මහජනතාව වෙනුවෙන් අලුත් සමුපකාර වෙළඳසැලක් විවෘත කර සිටිනවා. මෙම මන්ත්‍රීවරුන්හට සුභ පතන අතර මෙම

සමුපකාර වෙළඳසැල පවත්වාගෙන යාම සඳහා තෝරාගත් ගොඩනැගිල්ල කුලියට ලබාගත් එකක්. මේ සඳහා කුලියක් ගෙවීම ද අනාගතයේ දී එක්තරා බරක් වෙනවා. ජනතාව වෙනුවෙන් ඉදිකරන ලද සමුපකාර සමිති වෙළඳසැලක් තිබෙන අවස්ථාවේදී කුලියට ගොඩනැගිල්ලක් ලබාගෙන සමුපකාර වෙළඳ සැලක් පවත්වා ගෙන යා යුතුද යනුවෙන් ජනතාව කනස්සල්ල පල කරති. මේ සඳහා විසඳුමක් ලබාදීම සඳහා අප ප්‍රදේශයට අයත් සභාපතිතුමිය වශයෙන් ඔබතුමිය නීතිමය ක්‍රියාමාර්ග ගතයුතු බවට ඉල්ලා සිටිමි. ඔබතුමිය විසඳුමක් ලබා නොදෙන්නේ නම් ජනතාව විසින් උද්ඝෝෂණ ක්‍රියාමාර්ගයක් ගනු ඇතැයි මා අදහස් කරමි. ඒ නිසා අවශ්‍ය පරිදි සුදුසු තීරණයක් ලබා ගන්නා ලෙසට මා කාරුණිකව ඉල්ලා සිටිමි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

මේ පිළිබඳව විවිධ අවස්ථාවල ලිපි යොමු කර, ළඟ දී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා කාර්යාලය වෙත ගිය අවස්ථාවේදී මේ පිළිබඳව මම මතක් කළා. මෙම කාරණාව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාවටත් ඉදිරිපත් කරන ලෙසට පවසා තිබුණා. මේ සඳහා වූ අවශ්‍ය ඉදිරි කටයුතු මම ගන්නවා.

**<u>ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)</u>**

සභාව ආරම්භ කළ කාලයේ සිටම මේ පිළිබඳව මම සභාවේ දී කතා කර තිබෙනවා. සමුපකාර සමිති සාමාජිකයෙක් වශයෙන් ජනතාව වෙනුවෙන් කතා කළ නිසා මට ලැබුණු ණය මුදල පවා අත්හිටුවා තිබෙනවා. සාමිමලේ ප්‍රදේශයේ බොහෝ ඉඩම් විකුණා තිබෙනවා. තැපැල් කාර්යාලය මාසිකව රු. 5000.00 ක කුලියටයි පවතින්නේ. එනිසා මේ පිළිබඳව සභාව විසින් කඩිනම් පියවර ගත යුතු බවට මා ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

මේ සමඟ අද දින මෙම සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහයෝගය ලබාදීම පිළිබඳව ස්තූතිවන්ත වෙමින් මෙයින් සභාවේ වැඩ කටයුතු අවසන් කර සිටිමි.

ස්තූතියි.
ආයුබෝවන්.

සභාපති,
මස්කෙළිය ප්‍රාදේශීය සභාව,
මස්කෙළිය.

ලේකම්,
මස්කෙළිය ප්‍රාදේශීය සභාව,
මස්කෙළිය.